# ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රමය (Quota System) භාවිතය පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක්

ඩී.එච්.ඒ.එස්. සෝමරත්න
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
arunasrisampath193@gmail.com

---

**සංක්ෂේපය**

*පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවීමට අදාළ කතිකාවත 20 වන සියවසේ මුල් භාගයේ සිට ගොඩනැගුණි. ඒ සඳහා ලෝකයේ බොහෝ රටවල් ප්‍රමාණයක් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු සංකල්ප වෙත මාරුවීම මෙන් ම නව දේශපාලනික සංස්කෘතීන් එම රටවල බිහිවීමත් හා ස්ත්‍රීවාදී ව්‍යාපාරවල පිබිදීම ද හේතු විය. එසේ ස්ත්‍රීන්ට ද දේශපාලන ආයතනය හා තීරණගන්නා මට්ටම්වලදී ප්‍රමාණාත්මක නියෝජනයක් අවශ්‍ය වන බවට තර්කය ඉස්මතු වීම මත ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා විවිධ උපක්‍රම භාවිතය කෙරෙහි අවධානය යොමු විණි. ඒ අතරින් පංගු ක්‍රමය ප්‍රායෝගික උපක්‍රමයක් ලෙසින් යුරෝපා, ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකානු රටවල ව්‍යාප්ත වීම සිදු විය. මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වූයේ ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීමේ උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය භාවිතය කොතෙක් දුරට සාර්ථක ද යන්න තුලනාත්මකව අධ්‍යයනය කිරීමයි. ගුණාත්මක පර්යේෂණ සැලසුම යටතේ අධ්‍යයනයට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා ද්විතීයික දත්ත යොදා ගනු ලැබීය. සමස්ත දත්ත විශ්ලේෂණය සඳහා තේමාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී. අධ්‍යයනය මගින් හඳුනාගත හැකි වූයේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යන් ගණනාවක් ම ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය ඉතා සාර්ථක ක්‍රමවේදයක් ලෙසින් භාවිතා කරන අතර ඒ මගින් පෙරට වඩා එම රටවල ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මක අයුරින් වර්ධනයවී ඇති බවයි.*

**ප්‍රමුඛ පද -** *දේශපාලන නියෝජනය, ප්‍රජාතන්ත්‍රවාදය, පංගු ක්‍රමය, ස්ත්‍රී නියෝජනය*

## Abstract

The conversation on increasing the political representation of women over men dates back to the early part of the twentieth century. Many countries around the world have switched to the concepts of democratic government, as well as the emergence of new political cultures in those countries and the emergence of feminist movements. Similarly, the argument that women also need quantitative representation at the level of political institutions and decision-making has led to a focus on the use of various strategies to increase the representation of women. Among them, the quota system spread to Europe, Asia, Africa and Latin America as a practical tactic. The primary objective of this research was to comparatively study the effectiveness of the use of quota system as a strategy to increase female representation. Secondary data were used to obtain data for the study under the qualitative research plan. Thematic analysis methodology was used for the overall data analysis. The study found that a number of democracies have used the quota system as a very effective strategy to increase their representation, which has led to a quantitative and qualitative increase in women's representation in those countries.

***Keywords*** *– Democracy, Political representation, Quota System, Women representation*

## 1. හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් යටතේ පවතින ලෝකයේ සෑම රාජ්‍යයක් ම ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවීම සඳහා වන පංගු ක්‍රමය ඇතුළු වෙනත් උපක්‍රම භාවිතය කෙරේ අවධානය යොමු කර තිබේ. ඒ මගින් පුරුෂයන්ට සාපේක්ෂව දේශපාලනය නියෝජිත ආයතන හා තීරණ ගන්නා මට්ටම්වල ස්ත්‍රීන්ගේ නියෝජනය ප්‍රමාණාත්මක ලෙස වර්ධනයක් ලගා කර ගෙන ඇත. විශේෂයෙනේ ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා වන උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය භාවිතය සම්බන්ධයෙන් වූ අත්දැකීම් රටින් රටට වෙනස්ය. ඇතැම් සමාන දේශපාලනික සංස්කෘතික වටපිටාවක් පවතින රටවල ද පංගු ක්‍රමය භාවිතයේ යම් යම් සමානතා හඳුනාගත හැකි ය. පංගු ක්‍රම න්‍යාය ප්‍රායෝගික භාවිතය පිළිබඳ ව පළමු අත්දැකීම හමුවන්නේ නෝර්ඩික් රටවල්වලින් ය. 1975 දී පමණ නෝර්වේ සමාජවාදී වාමාංශික පක්ෂය විසින් සිය නාමයෝජනා ලැයිස්තුවට ස්ත්‍රීන් සඳහා 40%ක ප්‍රතිශතයක් වෙන් කිරීමට කටයුතු කිරීම එහි මූලාරම්භය ලෙස සැලකේ. නෝර්වේ සමාජවාදී පක්ෂයේ පූර්වාදර්ශයෙන් ආරම්භ වූ පංගු ක්‍රමය පසු ව නෝර්වේ අනෙකුත් පක්ෂ සඳහා ද ස්වීඩනය හා ඩෙන්මාර් යන රටවල පක්ෂ වෙත ද ව්‍යාප්ත විය. එසේ වුවත් මෙම රටවල් අපේක්ෂා කළ මට්ටමේ ස්ත්‍රී නියෝජන ප්‍රතිශතයක් ළඟා කර ගැනීමට නොහැකි වීම මත ඇතැම් නොර්ඩික් රටවල් පංගු ක්‍රමය නීතියෙන් තහවුරු කිරීමට කටයුතු කළේය (ලියනගේ,2012).

කැනඩාව, ඕස්ට්‍රේලියාව වැනි ඇතැම් යුරෝපානු රටවල් සිය පක්ෂ ප්‍රතිපත්ති මගින් ස්වේච්ඡා පංගු ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කෙරුණි. නමුත් ලතින් ඇමරිකානු කලාපයේ රටවල් 1990 දශකයේදී පමණ පංගු ක්‍රමය කෙරෙහි අවධානය යොමු කළේය. ලතින් ඇමරිකානු රටවල්වලින් වැඩි ප්‍රමාණයක් නාමයෝජනා ලැයිස්තු මගින් නීත්‍යානුකූල ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් වෙන් කර තිබේ. 1991 දී ආජන්ටිනාව මෙම ක්‍රමය පළමුවෙන් හඳුන්වා දුන් අතර පසු ව පේරු, පැනමා, බොල්විියා, බ්‍රසීලය ආදී රටවල්ද පංගු ක්‍රමය හඳුන්වා දුනි. 1980 ගණන් වන විට ලතින් ඇමරිකානු රටවල දේශපාලනය තුළ සිදු වූ ප්‍රජාතන්ත්‍රවාදී වෙනස්කම් හා ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්හි පිබිදීම පංගු ක්‍රම න්‍යාය සාර්ථකව ක්‍රියාත්මක වීම කෙරෙහි ප්‍රබල ලෙස ම බල පෑවේය. පංගු ක්‍රමය භාවිතය සම්බන්ධයෙන් අප්‍රිකානු රටවල් කිහිපයක ද අත්දැකීම් පවතී. දකුණු අප්‍රිකාවේ අප්‍රිකානු ජාතික කොංග්‍රසය විසින් ස්ත්‍රීන් සඳහා ස්වේච්ඡා පංගු ක්‍රමයක් වෙන් කිරීමට කටයුතු කිරීම එහි ආරම්භය ලෙස සැලකේ. එමෙන් ම 1986 දී පමණ උගන්ඩාව ස්ත්‍රීන් සඳහා ව්‍යවස්ථානුකූලව ආසන බෙදා වෙන් කිරීම සිදු කළ අතර ඩිජිබූටි, සෝමාලියාව, සුඩානය, එරිත්‍රියා වැනි නැගෙනහිර අප්‍රිකානු රටවල් ද මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට කටයුතු කෙරුණි. වෙනත් කලාපවලට සාපේක්ෂව මැදපෙරදිග රටවල් ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් යොමුකර ඇත්තේ අඩු අවධානයකි. ඊශ්‍රායලයේ පක්ෂ ස්වේච්ඡා පංගු ක්‍රමයක් භාවිතා කරන අතර, ඊජිප්තුව, ජෝර්දානය වැනි රටවල් සිය පාර්ලිමේන්තු ආසනවලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට කටයුතු කර ඇත (ලියනගේ,2012).

ස්ත්‍රී නියෝජනය පිළිබඳ ව ආසියානු කලාපය කෙරෙහි අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි වන්නේ ජාතික දේශපාලනයට වඩා පළාත් පාලන මට්ටමේ ස්ථරවල ස්ත්‍රීන්ගේ නියෝජනයේ යම් මට්ටමක වැඩි වීමක් පෙන්නුම් කරන බවයි. නේපාලය, ඉන්දියාව වැනි රටවල් එයට නිදසුන් සපයන අතර දීර්ඝ කාලීන ඉල්ලීම්වල ප්‍රතිඵලයක් වශයෙන් 2017 දී

ශ්‍රී ලංකාවේ ද පළාත් පාලන ආයතනවල නියෝජනය සඳහා 25%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට කටයුතු කෙරුණි (අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සංශෝධන පනත, 2017).

මේ ආකාරයෙන් පොදුවේ ස්ත්‍රීන් සඳහා වන පංගු ක්‍රම න්‍යාය භාවිතා කිරීම පිළිබඳ අත්දැකීම් කලාපයෙන් කලාපයට මෙන් ම රටින් රටට වෙනස්ය. ඒ අනුව පංගු ක්‍රමය භාවිතය සම්බන්ධයෙන් යුරෝපීය, ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු රටවල අත්දැකීම් සවිස්තරව සාකච්ඡා කිරීම ඉතා වැදගත් වේ.

## 2. අධ්‍යයන ගැටලුව

පුරුෂන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවීම පිණිස විවිධ උපක්‍රම භාවිතය සම්බන්ධයෙන් ගෝලීය වශයෙන් අවධානය යොමු වී ඇති පසුබිමක දේශපාලන නියෝජිත ආයතන හා තීරණ ගන්නා මට්ටම්වල ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අයුරින් වර්ධනය කිරීම සඳහා උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය වඩාත් යෝග්‍ය යැයි දේශපාලන විද්වතුන් තර්ක කරන්නේ ඇයි ද? යන්න මෙම අධ්‍යයනයෙහි ගැටලුව වේ.

## 3. අරමුණ

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වූයේ දේශපාලන නියෝජිත ආයතන තුළ ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක අයුරින් ඉහළ නැංවීමේ උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය භාවිතය කොතෙක් දුරට සාර්ථක ද යන්න තුලනාත්මකව අධ්‍යයනය කිරීමයි.

## 4. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමය මත පදනම් වන අතර, දත්ත එක්රැස් කිරීමේදී මූලික වශයෙන් ද්විතීයික දත්ත යොදා ගන්නා ලදී. එහිදී ද්විතීයික දත්ත ලෙස අධ්‍යයනය හා සම්බන්ධ ග්‍රන්ථ, ලිපි, වාර්තා, සඟරා, සංඛ්‍යා ලේඛන මෙන් ම අන්තර්ජාලය ද පරිශීලනය කළ අතර, සමස්ත දත්ත විශ්ලේෂණයේදී තේමාත්මක විශ්ලේෂණ ක්‍රමවේදයට යටත්ව පොදු තේමාවන්, මාතෘකා, අදහස් හා අර්ථ රටාවන් හඳුනා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කර ඇත.

## 5. සාකච්ඡාව හා විශ්ලේෂණය

### 5.1. පංගු ක්‍රමය හැඳින්වීම

සාමාන්‍ය ව්‍යවහාරයේ දී පංගුව යන පදය භාවිතා වන්නේ යම් නිශ්චිත කොටසක් හෝ ප්‍රමාණයක් හැඳින්වීම සඳහා ය. පංගුවක් වෙන් කිරීම යන යෙදුම එදිනෙදා විවිධ අවස්ථාවල ප්‍රායෝගිකව ද භාවිතා කරයි. එය නිදසුන් කිහිපයක් ආශ්‍රයෙන් පැහැදිලි කර ගත හැක. විශේෂයෙන් ඇඟළුම් වැනි ක්ෂේත්‍රයේ පවතින රැකියා සඳහා ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයන් ද යම් ප්‍රමාණයක් බඳවා ගනු ලබයි. එසේ ම හෙද සේවය සඳහා ද ප්‍රාථමික අංශවලට ගුරුවරුන් වශයෙන් ද පුරුෂයන් ප්‍රමාණයක් බඳවා ගැනේ. එසේ ස්ත්‍රීන් පමණක් වැඩි වශයෙන් නියෝජනය වන අවස්ථාවල පුරුෂයන් ද පුරුෂයන් වැඩි වශයෙන් නියෝජනය වන අවස්ථාවල ස්ත්‍රීන් ද යම් මට්ටමක නියෝජනය වීමේ අවශ්‍යතාව පිණිස නිශ්චිත කොටසක් බඳවා ගැනීමට පංගු ක්‍රමය භාවිතා කරයි. මේ අනුව පැහැදිලි වන්නේ යම්කිසි

ආයතනයක වෘත්තිකයන් අඩුවෙන් නියෝජනය වන කණ්ඩායම වෙනුවෙන් වැඩි නියෝජන අවස්ථාවක් ලබාදීම පංගුවක් නැතිනම් ප්‍රතිශතයක් වෙන් කිරීම හරහා සිදු වේ.

පංගු ක්‍රමය හෝ අනුපාත ක්‍රමය දේශපාලනයේ දී භාවිතා වන්නේ යම් ජනවර්ගයක්, පුද්ගල කාණ්ඩයක් හෝ සුවිශේෂී පිරිසක් ප්‍රමාණාත්මකව නියෝජනය වීම සඳහා ය. දේශපාලනයේ දී පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් නියෝජනය වන්නේ ඉතා අඩු ප්‍රතිශතයක්ය. ඒ නිසාවෙන් ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා යොදා ගන්නා උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය භාවිතා කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මඟින් මැතිවරණ නීති හරහා මෙන් ම දේශපාලන පක්ෂ ස්වේච්ඡාවෙන් පංගු ක්‍රමය හඳුන්වා දී තිබේ.

## 5.2. ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් අවශ්‍ය වන්නේ ඇයි?

ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් අවශ්‍ය වන්නේ ඇයි ද යන්න පිළිබඳ ව සාකච්ඡා කළ යුතු ය. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සංකල්ප අතර සමාන ඉඩ ප්‍රස්ථා, සමාන නියෝජනය හා සමාන අයිතිවාසිකම් වැදගත් වේ. එසේ වුවත් මෙම සංකල්පය ප්‍රායෝගික භාවිතයේ දී විශේෂයෙන් සමාන නියෝජනය යන අදහස පිළිගැනීමට පුරුෂ මූලික සමාජය එතරම් කැමැත්තක් නොදක්වයි. ස්ත්‍රීන් යනු ගෘහයේ කාර්යයන්ට පමණක් සීමා වී සිටින චරිතයක් ලෙසින් පිළිගැනේ. පොදු දේශපාලන ක්ෂේත්‍රයෙන් ස්ත්‍රිය ඉවත් කිරීම සඳහා සාම්ප්‍රදායිකව පවතින දුර්මතවාද ද ප්‍රබල ලෙසට ම බලපෑම් කර ඇත. දේශපාලනයේ දී සමාන නියෝජන හා සමාන ඉඩ ප්‍රස්ථා ස්ත්‍රීන්ට හිමි විය යුතු ය යන අදහස සාධාරණීකරනය කිරීම සඳහා තර්ක ගණනාවක් ම ඉදිරිපත් වී ඇත. ඒ අතරින් ඈන් ෆිලිප්ස් ගේ (Ann Phillips) සමාන අයිතිවාසිකම් පිළිබඳ තර්කය වැදගත් වේ (Phillips,1995). ඈන් ෆිලිප්ස් පෙන්වා දෙන්නේ ස්ත්‍රී පුරුෂ වශයෙන් ශාරීරික වෙනස්කම් පැවතිය ද හැකියා, දක්ෂතා අතින් සමාන බැවින් පුරුෂයාට හිමිවන සමාජ සාධාරණත්වය හා ඉඩ ප්‍රස්ථාවන් ස්ත්‍රීයට හිමි විය යුතු බවයි. නමුත් ස්ත්‍රී- පුරුෂ සමාජ භූමිකා මත සලකා සමාජ කාර්යයන් වෙන් කිරීම මඟින් ස්ත්‍රීන් අප්‍රධාන හා අසාධාරණත්වයට පත්ව ඇති අතර එය වඩාත් දේශපාලන ව්‍යුහය තුළ පිළිබිඹු වන බව ඔහු පෙන්වා දෙයි. එබැවින් ස්ත්‍රී පුරුෂ සමාන ඉඩ ප්‍රස්ථා, අයිතිවාසිකම් හා නියෝජනය එක් පාර්ශවයකට පමණක් කේන්ද්‍රගතව පවතින තත්ත්වයක් තුළ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වේ යැයි අපේක්ෂා කිරීමට නොහැකි බවට ද ඔහු තර්ක කරයි.

මේ සම්බන්ධව ඉදිරිපත් වී ඇති තවත් තර්කයක් වන්නේ උපයෝගීතාවය නැතිනම් අවශ්‍යතාවය පිළිබඳ ව වන තර්කයයි. මෙයින් පැහැදිලි කරන්නේ යම් දේශපාලන ක්‍රමයක විවිධ අවශ්‍යතා පවතී. එම අවශ්‍යතා හඳුනාගනිමින් ඊට සුදුසු පිළියම් ලබාදීම වෙනුවෙන් ගැළපෙන දැනුමින් හා අත්දැකීම්වලින් පරිපූර්ණ පිරිසක් සිටිය යුතු ය යන්නයි. ස්ත්‍රීන් සම්බන්ධ ජාතික ගැටලුවකට විසඳුම් සෙවීමේ දී වඩාත් ගැළපෙන්නේ එම කණ්ඩායම නියෝජනය වන ඒ සම්බන්ධයෙන් වූ විශේෂඥ දැනුමක් පවතින පිරිසක් ය. එසේ ම යම් කරුණක් සම්බන්ධයෙන් පොදු මතයක් ගොඩනැඟීමේ දී එක් පාර්ශවයක් පමණක් නොව අනෙක් පාර්ශවයේ ද අදහස් වැදගත් වේ. විශේෂයෙන් දේශපාලන ක්ෂේත්‍රයේදී යම් යම් තීරණයන්ට එළඹීමේ දී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ ම ඒකාබද්ධතාවයෙන් කටයුතු කිරීම මඟින් එය වඩාත් සාර්ථකව සිදු කළ හැකි ය (Sawer,1999).

ස්ත්‍රී නියෝජනයට පක්ෂව ඉදිරිපත්ව ඇති තවත් තර්කයක් වන්නේ පෙළඹවීමේ තර්ක යයි (ලියනගේ,2012). පිතෘ මූලික සමාජ ක්‍රමය සම්ප්‍රදායික දෘෂ්ටීන් දෙකක් මත පදනම් වෙයි. ඉන් පළමුවැන්නෙන් කියවෙන්නේ ස්ත්‍රිය යනු, ස්වාභාවයෙන් ම ළාමක ගති පැවතුම් ඇති

සමාජ කටයුතුවලින් දුරස් වූ නිවසේ කාර්යයන්ට පමණක් සීමා වූ තැනැත්තියක් ලෙසිනි. දෙවැන්නෙන් අර්ථවත් වන්නේ පුරුෂයා යනු ස්ත්‍රියට වඩා රළු ගති පැවතුම්වලින් යුක්ත සමාජ සම්බන්ධතා ඇති රැඩිකල් තැනැත්තියෙකු ලෙස ය. මෙම සම්ප්‍රදායික දෘෂ්ටීන් මඟින් ස්ත්‍රිය පොදු කාර්යයන්ගෙන් ඉවත් කිරීම දේශපාලනික වශයෙන් ඇගේ නියෝජනය අවම වීම කෙරෙහි සෘජුවම බලපායි. එබැවින් ස්ත්‍රීන් මෙම මතිමතාන්තරවලින් ඉවත්ව දේශපාලන කටයුතුවල නියැලීම කළ යුතු ය. එවිට පුරුෂයාට පමණක් නොව ස්ත්‍රියට ද පොදු කාර්යන්වලට සම්බන්ධ වී කටයුතු කළ හැකි ය යන ආදර්ශය සමාජයට ලබා දිය හැකි ය. ඒ හරහා ස්ත්‍රීන් දේශපාලනයට සම්බන්ධවීම කෙරෙහි පෙරට වඩා උනන්දුවක් මෙන් ම ආශාවක් ඇති වේ.

සංකේතාත්මක තර්කය මඟින් ද ස්ත්‍රී නියෝජනය තහවුරු කිරීමට අදාළ අදහස් කිහිපයක් ඉදිරිපත් කරයි. මෙම තර්කය තුළින් පෙන්වා දෙන්නේ ස්ත්‍රීන් නියෝජිත ආයතනවල හා තිරණ ගන්නා මට්ටම්වල නියෝනය වීම සමස්ත ස්ත්‍රී ප්‍රජාවගේ ම යහපත හා සුභසිද්ධිය වෙනුවෙන් බලපාන බවයි. ස්ත්‍රීන්ගේ අපේක්ෂා හා බලාපොරොත්තු ජාතික අභිලාෂ ලෙස සලකා ප්‍රතිපත්ති වැඩසටහන්වලට පර්වතනය වීම ද සිදු වේ. එමෙන් ම පුරුෂ මූලික දේශපාලන ආයතන සඳහා ස්ත්‍රීන් ද සම්බන්ධ වී මෙන් පුරුෂධිපත්‍යය බිඳ වැටෙන අතර, එම ආයතනයන් තුළ සුජාතභාවය හා නිත්‍යානුකුලභාවය ද ආරක්ෂා වේ (Mansbridge,1999).

## 5.3. පංගු ක්‍රම වර්ගීකරණය

ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා වූ උපක්‍රමයක් ලෙසින් ලොව රටවල් විශාල ප්‍රමාණයක් පංගු ක්‍රම න්‍යාය භාවිතා කරයි. එසේ පංගු ක්‍රමය භාවිතා කිරීමේ දී සමහර රටවල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මෙන් ම මැතිවරණ නිතී හරහා පංගු වෙන්කිරීම සිදු කර ඇත. එමෙන් ම දේශපාලන පක්ෂ විසින් ස්වේච්ඡා පංගුවක් වෙන් කිරීමට ද කටයුතු කර තිබේ. එසේ පංගු ක්‍රමය භාවිතා කළ රටවල් පොදුවේ යොදාගත් ආකෘතීන් කිහිපයක් වේ (ලියනගේ,2012).

1 පාර්ලිමේන්තුව හෝ පළාත් පාලන ආයතනවල නියෝජිත ආයතනවලින් නිශ්චිත ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම.

මෙම ක්‍රමය යටතේ මැතිවරණ ඡන්ද කොට්ඨාසවලින් යම් ප්‍රමාණයක් හෝ නියෝජිත ආයතනවලින් කිසියම් අනුපාතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ මැතිවරණ නීති මඟින් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම සිදු කරයි.

2 ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය

දේශපාලන පක්ෂ විසින් නාමයෝජනා ලැයිස්තුවලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය යටතේ සිදු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියෙන් හෝ මැතිවරණ නීති මඟින් මෙම ප්‍රතිශතය වෙන් කළ හැකි ය.

3 ස්වේච්ඡා පංගු ක්‍රමය

දේශපාලන පක්ෂ විසින් පක්ෂ ව්‍යවස්ථා හෝ නීති මඟින් මැතිවරණ නාම යෝජනාවලින් යම් පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම ස්වේච්ඡා පංගු ක්‍රමය මඟින් සිදු කෙරේ. බටහිර යුරෝපානු රටවල්, ස්කැන්ඩිනේවියානු රටවල් හා ඇතැම් ලතින් ඇමෙරිකානු කලාපයට

අයත් රටවල් ද මෙම ක්‍රමය භාවිතා කරයි. පින්ලන්තය, නෝර්වේ වැනි රටවල නාමයෝජනා ලැයිස්තුවෙන් 60% වඩා පුරුෂයන් ඇතුලත් නොවිය යුතු බවට දක්වා ඇත. ඒ හරහා ඉතිරි 40% ප්‍රමාණය අනිවාර්යෙන් ම ස්ත්‍රීන් නියෝජනය විය යුතු ය. මේ අයුරින් ලෝකයේ රටවල් 90 කට වැඩි ප්‍රමාණයක් පංගු ක්‍රම ආකෘති අතරින් එකක් හෝ කිහිපයක් භාවිතා කරයි.

## 5.4. ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා පංගු ක්‍රමය භාවිතය

ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් යටතේ පවතින ලෝකයේ සෑම රාජ්‍යයක් ම පාහේ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවීම සඳහා පංගු ක්‍රමය ඇතුළු වෙනත් උපක්‍රම භාවිතා කරයි. දැනට රටවල් 97 වැඩි ප්‍රමාණයක් පංගු ක්‍රමය හා වෙනත් උපක්‍රම භාවිතය කෙරෙහි අවධානය යොමු කර තිබේ. ඒ හරහා පුරුෂයන්ට සාපේක්ෂව දේශපාලනය නියෝජිත ආයතන හා තීරණ ගන්නා මට්ටම්වල ස්ත්‍රීන්ගේ නියෝජනය ප්‍රමාණාත්මක ලෙස වර්ධනයක් අද වන විට දැකිය හැකි ය. විශේෂයෙනේ පංගු ක්‍රමය හා වෙනත් උපක්‍රම භාවිතය සම්බන්ධයෙන් වූ අත්දැකීම් රටින් රටට වෙනස්ය. ඇතැම් සමාන දේශපාලනික සංස්කෘතික වටපිටාවක් පවතින රටවල පංගු ක්‍රමය භාවිතයේ යම් යම් සමානතා ද දැකිය හැකි ය. පංගු ක්‍රම න්‍යාය ප්‍රායෝගික භාවිතය පිළිබඳ පළමු අත්දැකීම හමුවන්නේ නෝර්ඩික් රටවල්වලින් ය (ලියනගේ,2012). 1975 දී පමණ නෝර්වේ සමාජවාදී වාමාංශික පක්ෂය විසින් සිය නාමයෝජනා ලැයිස්තුවට ස්ත්‍රීන් සඳහා 40%ක ප්‍රතිශතයක් වෙන් කිරීමට කටයුතු කිරීම එහි මූලාරම්භය ලෙස සැලකේ. නෝර්වේ සමාජවාදී පක්ෂයේ පූර්වාදර්ශයෙන් ඇරඹී පංගු ක්‍රමය පසු ව නෝර්වේ අනෙකුත් පක්ෂ සඳහා ද සිවීඩනය හා ඩෙන්මාර් යන රටවල පක්ෂ වෙත ද ව්‍යාප්ත විය. එසේ වුවත් මෙම රටවල් අපේක්ෂා කළ මට්ටමේ ස්ත්‍රී නියෝජන ප්‍රතිශතයක් ළඟාකර ගැනීමට නොහැකි වීම මත ඇතැම් නොර්ඩික් රටවල් පංගු ක්‍රමය නීතියෙන් තහවුරු කිරීමට කටයුතු කළේය (Ballington & Binda,2005).

කැනඩාව, ඕස්ට්‍රේලියාව වැනි සමහර යුරෝපානු රටවල් සිය පක්ෂ ප්‍රතිපත්ති මගින් ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා දීමට කටයුතු කෙරුණි. නමුත් ලතින් ඇමරිකානු කලාපයේ රටවල් 1990 ගණන්වල පංගු ක්‍රමය කෙරෙහි අවධානය යොමු කළේය. ලතින් ඇමරිකානු රටවල්වලින් වැඩි ප්‍රමාණයක් නාමයෝජනා ලැයිස්තු මඟින් නීත්‍යානුකූල ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් වෙන් කර තිබේ. 1990 දී අජන්ටිනාව මෙම ක්‍රමය පළමුවෙන් හඳුන්වා දුන් අතර පසුව පේරු, පැනමා, බොල්වියා, බ්‍රසීලය ආදී රටවල් ද පංගු ක්‍රමය හඳුන්වා දුනි (ලියනගේ,2012). 1980 ගණන් වන විට ලතින් ඇමරිකානු රටවල දේශපාලනය තුළ සිදු වූ ප්‍රජාතන්ත්‍රවාදී වෙනස්කම් හා ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්හි පිබිදීම පංගු ක්‍රම න්‍යාය සාර්ථකව ක්‍රියාත්මක වීම කෙරෙහි ප්‍රබල ලෙස ම බල පෑවේය.

පංගු ක්‍රමය භාවිතය සම්බන්ධයෙන් අප්‍රිකානු රටවල් කිහිපයක ද අත්දැකීම් පවතී. දකුණු අප්‍රිකාවේ අප්‍රිකානු ජාතික කොංග්‍රසය විසින් ස්ත්‍රීන් සඳහා ස්වේච්ඡා පංගු ක්‍රමයක් වෙන් කිරීමට කටයුතු කිරීම එහි ආරම්භය ලෙස සැලකේ. එමෙන් ම 1986 දී පමණ උගන්ඩාව ස්ත්‍රීන් සඳහා ව්‍යවස්ථානුකූලව ආසන බෙදා වෙන් කිරීම සිදු කළ අතර, ඩිජිබුටි, සෝමාලියාව, සුඩානය, එරිත්‍රියා වැනි නැගෙනහිර අප්‍රිකානු රටවල් ද මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට කටයුතු කෙරුණි.

වෙනත් කලාපවලට සාපේක්ෂව මැදපෙරදිග රටවල් ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් යොමුකර ඇත්තේ අඩු අවධානයකි. ඊශ්‍රායලයේ පක්ෂ ස්වේච්ඡා පංගු ක්‍රමයක් භාවිතා කරයි. ඊජිප්තුව, ජෝර්දානය වැනි රටවල් සිය පාර්ලිමේන්තු ආසනවලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන්

සඳහා වෙන් කිරීමට කටයුතු කර ඇත.

ස්ත්‍රී නියෝජනය පිළිබඳ ව ආසියානු කලාපය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී හඳුනාගත හැකි වන්නේ, ජාතික දේශපාලනයට වඩා පළාත් පාලන මට්ටමේ ස්ථරවල ස්ත්‍රීන්ගේ නියෝජනයේ යම් මට්ටමක වැඩි වීමක් පෙන්නුම් කරන බවයි. නේපාලය, ඉන්දියාව වැනි රටවල් එයට නිදසුන් සපයන අතර, දීර්ඝ කාලීන ඉල්ලීම්වල ප්‍රතිඵලයක් වශයෙන් 2017 දී ශ්‍රී ලංකාවේ ද පළාත් පාලන ආයතනවල නියෝජනය සඳහා 25% ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට කටයුතු කර ඇත.

මේ ආකාරයෙන් පොදුවේ ස්ත්‍රීන් සඳහා වන පංගු ක්‍රම න්‍යාය භාවිතා කිරීම පිළිබඳ අත්දැකීම් කලාපයෙන් කලාපයට මෙන් ම රටින් රටට වෙනස්ය. ඒ අනුව පංගු ක්‍රමය හා වෙනත් උපක්‍රම භාවිතය සම්බන්ධයෙන් යුරෝපීය, ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු රටවල අත්දැකීම් තුලනාත්මකව හා සවිස්තරව සාකච්ඡා කිරීම ඉතා වැදගත් වේ.

## 5.5. යුරෝපයේ රටවල් පංගු ක්‍රමය භාවිතය

ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවක් දැකිය හැකි වන්නේ ස්කැන්ඩිනේවියානු රටවලින් ය. එසේ ස්කැන්ඩිනේවියානු රටවල්වල ස්ත්‍රී නියෝජනය ප්‍රතිශතය ඉහළ වර්ධනයක් පෙන්නුම් කිරීමට පංගු ක්‍රම න්‍යායේ භාවිතය හේතු වී ඇති බව පිළිගත් කරුණකි (Phillips,1995). එසේ වුවද පංගු ක්‍රම න්‍යාය භාවිතා කිරීම්ට පෙර එනම් 1980 දශකය පමණ වන විට පවා ස්ත්‍රී නියෝජනය 20%-30% අතර ප්‍රමාණයක් පැවති බවට හඳුනාගත් හැකි ය. ස්කැන්ඩිනේවියානු රටවල් අතරින් ස්ත්‍රී නියෝජනයේ ඉහළ මට්ටමක පවතින රට ලෙස සැලකෙන්නේ ස්වීඩනයයි. ස්වීඩනය තුළ ස්ත්‍රී නියෝජනය වර්ධනය වීම දීර්ඝ කාලීන ප්‍රථිඵලයකි. 1970 පමණ වන විට පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 14%ක් පමණ වූ අතර එය 1988 වන විට 38% දක්වාත් 2000 වර්ෂය වන විට 43% දක්වා ක්‍රමිකව වර්ධනය විය. 2012 වන විට 48% නියෝජන ප්‍රතිශතයක් ගනු ලැබූවත් 2018 මැතිවරණ ප්‍රතිඵලවලට අනුව එය 46% දක්වා සුළු අඩුවීමක් දැකිය හැකි ය.

ස්වීඩනයේ ස්ත්‍රී නියෝජනය ක්‍රමිකව වර්ධනය වීම සඳහා දේශපාලන සංස්කෘතිය මෙන් ම ආර්ථික හා සමාජ රටාවේ ප්‍රගතිශීලී ලක්ෂණ ද හේතුවී ඇත (Fridenvall,2003). ස්වීඩනයේ සියලු දේශපාලන පක්ෂ 1970 ගණන් වන විට ස්ත්‍රීන් සඳහා දේශපාලන නියෝජනය පුළුල් කළ යුතු ය යන අවශ්‍යතාව පොදුවේ හඳුනාගත් අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 1972 වන විට ස්වීඩන් ලිබරල් පක්ෂය විසින් සිය පක්ෂයේ අභ්‍යන්තර කමිටුවල සංවිධාන ව්‍යුහය තුළ ස්ත්‍රීන් 40% ප්‍රමාණය විය යුතු බව පෙන්වා දුනි (ලියනගේ,2012). එමෙන් ම 1988 දී ලිබරල් පක්ෂය තම පක්ෂය ප්‍රතිපත්තියක් ලෙස Zipper ක්‍රමය නාම යෝජනා ලැයිස්තු සඳහා හඳුන්වා දෙන ලදී. 1987 පමණ වන විට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ද නාමයෝජනා ලැයිස්තුවලට 40%ක ප්‍රමාණයක් අවම වශයෙන් ස්ත්‍රීන් ඇතුළත් විය යුතු බවට වන ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කළේය. මීට සමගාමීව 1994 වර්ෂයේ දී සිය නාම යෝජනා ලැයිස්තුවට Zebra ක්‍රමය හඳුන්වා දෙමින් ස්ත්‍රී පුරුෂ සමාන නියෝජන ප්‍රතිපත්තිය ඉදිරිපත් කළේය. 1981 දී ග්‍රීන් පක්ෂය හා 1987 දී වාමාංශික පක්ෂයත් සිය පක්ෂ අභ්‍යන්තර කමිටු සඳහා 40% ස්ත්‍රීන් නියෝජනය විය යුතු ය යන ප්‍රතිපත්තිය හඳුන්වා දුනි (ලියනගේ,2012). පසු ව 1989 වන විට ග්‍රීන් පක්ෂයත් 1997 වන විට වාමාංශික පක්ෂයත් එම ප්‍රතිශතය 50% දක්වා වැඩි කිරීමට කටයුතු කෙරුණි.

ස්වීඩනයේ දේශපාලන පක්ෂ විසින් හඳුන්වා දෙනු ලැබූ ප්‍රතිපත්ති හා උපක්‍රම ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක ලෙස වර්ධනයට හේතු විය. විශේෂයෙන් 1970 ගණන් වන විට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ජාතික හා පළාත් පාලන මට්ටමේ දී ස්ත්‍රීන් ප්‍රමාණවත් තරම් නියෝජනය නොවීම සමාජ ගැටලුවක් ලෙස හඳුනා ගනු ලැබූ අතර, එයට විසඳුම් සෙවීම සඳහා ස්ත්‍රීවාදී සංවිධාන සමඟ ඒකාබද්ධව කටයුතු කරන ලදී. එහි දී ස්ත්‍රීවාදී ව්‍යාපාරයන් අධ්‍යයනය තුළින් ලබාගත් නිර්දේශයන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වෙත යොමු කෙරුණි. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් 1993 වන විට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ස්ත්‍රී පුරුෂ අසමානතාවය තුරන්කර ස්ත්‍රීන් සඳහා සාධාරණත්වය ඉටු කිරීම පිණිස වන කරුණු තුනක් ඉදිරිපත් කළේය. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර පවතින වැටුප් අසමානත්වය ඉවත් කිරීම, ස්ත්‍රීන්ට එරෙහි ලිංගික හිංසනය හා ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම මෙන් ම පක්ෂය තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය ඉහළ නැංවීම එම කරුණු ය. පවුල හා ඉන් පිටත සමාජයේ දී පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රීය භුක්තිවිඳින නිදහස හා වරප්‍රසාද අවම මට්ටමක පවතින අතර දේශපාලන ක්ෂේත්‍රයේ ද දේශපාලනික දැනුම, උනන්දුව, කැමැත්ත හා අත්දැකීම් අතර ස්ත්‍රී පුරුෂ විභේදනයක් දැකිය හැකි බවත් පෙන්වා දුනි. මෙයට අමතරව ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා පියවර ගන්නා ලෙස ස්වීඩනයේ ස්ත්‍රීවාදී සංවිධාන ජාලයක වූ ස්ටොකින් ව්‍යාපාරයට සහය දීමේ ව්‍යාපාරයේ බලපෑම්වලට ද සමාජවාදී පක්ෂයට මුහුණදීමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් මත පාර්ලිමේන්තු හා පළාත් මට්ටමේ දී ස්ත්‍රීන් නියෝජනය වීම සඳහා Zipper ක්‍රමය හඳුන්වා දීමට කටයුතු කළේය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය මෙන් ස්වීඩන් කොන්සර්වේටිව් පක්ෂ අභ්‍යන්තරයේ ස්ත්‍රී නියෝජනය වැඩි කිරීම සඳහා වන අරගලය දියත් විණි. කොන්සර්වේටිව් පක්ෂයේ ස්ත්‍රී ෆෙඩරේෂණය 1970 ආරම්භයේ සිට ම ස්ත්‍රී නියෝජනයේ වැදගත්කම පිළිබඳ ව අවධානය යොමු කළේය. ස්ත්‍රී ෆෙඩරේෂණය විසින් 1975 දී ස්ත්‍රීන්ට නාම යෝජනා ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කළ ද කොන්සර්වෙටිව් පක්ෂය විසින් එය ප්‍රතික්ෂේප කෙරුණි. මෙම තත්ත්වය මත ස්ත්‍රී ෆෙඩරේෂණය හා පක්ෂය අතර අරගලය 1990 ගණන් දක්වා ම පැවතුණි. පක්ෂයේ ස්ත්‍රීන් හා පුරුෂයන් වෙන් වෙන් වශයෙන් බෙදී ක්‍රියාත්මක වීම ද පක්ෂය සඳහා ස්ත්‍රීන්ගේ ඡන්ද අඩුවීම ද පක්ෂය කෙරෙහි සමාජ ප්‍රතිරූපය බිඳ වැටීමට හේතුවිය. මෙම පසුබිම මත කොන්සර්වේටිව් පක්ෂයට ස්ත්‍රී - පුරුෂ බෙදීම නිසා සමාජ ප්‍රතිරූපය යළි ලබා ගැනීමට අවශ්‍ය වූ අතර, ඒ සඳහා පළාත් පාලන ආයතනවල ස්ත්‍රීන්ට වැඩියෙන් නාම යෝජනා ලබා දීමටත් පාර්ලිමේන්තු කමිටුවල ස්ත්‍රී නියෝජනය වැඩි කිරීමටත් කටයුතු කළේය. ස්ත්‍රී ෆෙඩරේෂණය විසින් ගෙන ගිය අරගලයෙහි ප්‍රතිඵලය අද වන විටත් ස්වීඩනයේ අනෙක් පක්ෂවලට සාපෙක්ෂව පළාත් පාලන ආයතන තුළ හා පක්ෂ අභ්‍යන්තර කමිටුවල ස්ත්‍රී නියෝජනය ඉහළ මට්ටමක පවතී (ලියනගේ,2012).

ජර්මනියෙහි ක්‍රියාත්මක වන මිශ්‍ර නියෝජන ක්‍රමය (පහළ මණ්ඩලයට නියෝජිතයන් තෝරා ගැනීම සඳහා භාවිතා කරන) ස්ත්‍රී නියෝජනයේ වර්ධනයට ප්‍රබල හේතුවක් වී ඇතැයි ඔවුන් පොදුවේ පිළිගන්නා කරුණකි. ජර්මනියේ ක්‍රියාත්මක වන ප්‍රධාන දේශපාලන පක්ෂ අතරින් තුනක් සිය අභ්‍යන්තර ප්‍රතිපත්ති මගින් සිදු කරනු ලැබූ වෙනස් කිරීම් මත නාමයෝජනා ලැයිස්තුවෙන් 40% -50% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කර තිබේ. 1980 දී ග්‍රීන් පක්ෂය විසින් Zipper ක්‍රමය මගින් ස්ත්‍රීන් හා පුරුෂයන්ට 50% සමාන නියෝජනයක් ලබා දීමට කටයුතු කළේය. ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය 1988 වන විට සිය පක්ෂයේ අභ්‍යන්තර තනතුරුවලින් 1/3ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ යුතු බවට තීරණය කළ අතර, 1994න් පසු ව එය 40% දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති හඳුන්වා දුනි. තව ද 1996

වන විට ක්‍රිස්තියානි ඩිමොක්‍රටික් පක්ෂය විසින් සිය පක්ෂ තනතුරු හා නාම යෝජනා ලැයිස්තු සඳහා 30% ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමේ ක්‍රමය හඳුන්වා දීමට කටයුතු කළේය (ලියනගේ,2012).

ජර්මන් ව්‍යවස්ථාදායකයෙහි දැනට වැඩි ප්‍රමාණයක් ස්ත්‍රී නියෝජනය කරනු ලබන්නේ ග්‍රීන් පක්ෂයෙනි. එය 57%කි. අනෙකුත් පක්ෂ වන ක්‍රිස්තියානි ඩිමොක්‍රටික් පක්ෂයේ ස්ත්‍රී නියෝජනය 19.5%ක් වන අතර, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ජාතික නියෝජනය 35% කි. ස්ත්‍රී නියෝජනය වැඩි කිරීම සඳහා ප්‍රධාන දේශපාලන පක්ෂ නාම යෝජනා ලැයිස්තුවලින් 40% - 50% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට තීරණය කළ ද දක්ෂිණාංශික පක්ෂය වැනි ඇතැම් පක්ෂ එම ක්‍රමය ප්‍රතික්ෂේප කළේය. එසේ ම පක්ෂවල සිදු කළ වෙනස්කම්වලට සාපේක්ෂව ස්ත්‍රීන් සම්බන්ධයෙන් සමාජ ව්‍යුහය තුළ වෙනස්කම් ඇති නොවීම ද ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් වර්ධනය නොවීමට හේතු වී ඇත.

නියෝජනයේ දී ස්ත්‍රී පුරුෂ සමනාත්මතාවය තහවුරු විය යුතු ය යන අදහස ප්‍රංශයෙහි තහවුරු වීම 1999 දී මැතිවරණ නීති සංශෝධනය හරහා සිදුවිය. එයට පෙර 1982 දී සමාජවාදී රජය යටතේ පළාත් පාලන ආයතන සඳහා මැතිවරණය නාම යෝජනා ලැයිස්තුවලින් 25%ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට නීතියක් සම්මත වූවත් එය ප්‍රතික්ෂේප විය. 2007 පැවති මැතිවරණ ප්‍රතිඵලවලට අනුව ප්‍රංශ ව්‍යවස්ථාදායකයේ කාර්ය මණ්ඩලය සඳහා ස්ත්‍රී නියෝජනය 18.9% කි. දෙවන මණ්ඩලයේ එය 22.2% කි. 1999 දී සම්මත කරගනු ලැබූ නීතියට අනුව පළාත් පාලන, ප්‍රදේශීය ආයතන සඳහා ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාව තහවුරු වන ආකාරයේ නාමයෝජනා සකස් කිරීමට කටයුතු කෙරුණි. මෙම නීතියට අනුව සකස් නොකළ සියලු නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමටත් එසේ ඉදිරිපත් කරන පක්ෂ සඳහා මුදලින් වන්දි ගෙවීමට සිදුවීය. මේ අනුව 2001 වසරේ පැවැති පළාත් පාලන මැතිවරණයේ දී 25%ක් ව පැවති ස්ත්‍රී නියෝජනය 47%ක් දක්වා වර්ධනය විය. 2017 වනවිට ප්‍රංශයේ ජාතික ව්‍යවස්ථාදායකයේ පහළ මණ්ඩලය (Lower or Single House) තුළ ස්ත්‍රී නියෝජනය 39.6ක් වූ අතර, ඉහළ මණ්ඩලයේ (Upper Chamber) එය 29.3% ක් බවට පත් විය (Inter Parliamentary Union Report ,2018).

කැනඩාව බෙල්ජියම හා ඕස්ට්‍රේලියාව වැනි රටවල ද ස්ත්‍රීන්ගේ නියෝජනය ඉහළ නැංවීමට අදාළ උපක්‍රම අනුගමනය කර ඇත. ඒ අතරින්,

1. නාමයෝජනා ලැයිස්තුවලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම

2. පංගු ක්‍රමය භාවිතය හරහා ආසන වෙන් කිරීම

3. පක්ෂ අභ්‍යන්තර තනතුරුවලින් යම් කොටසක් ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කිරීම, වැනි ක්‍රමවේද භාවිතා කරයි.

1985 දී කැනඩාවේ නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ෆෙඩරල් මැතිවරණවල දී ස්ත්‍රීන් සඳහා නාම යෝජනාවලින් 50%ක් ලබාදීමට කටයුතු කළ අතර පක්ෂයේ අභ්‍යන්තර තනතුරුවලින් 50%ක් ද ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. 2015 මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පහළ මණ්ඩලයේ (Lower or Single House) ආසන 334න් 90 දෙනෙක් ස්ත්‍රීන් තේරී පත් විය. එය 26.9% ප්‍රතිශතයකි. ඉහළ මණ්ඩලයේ (Upper Chamber) ආසන 105න් 49ක් ස්ත්‍රීන් නියෝජනය වූ අතර එය 46.7%ක ඉහළ ප්‍රතිශතයකි. අවසන් වරට 2019 දී පැවති මැතිවරණයේ දී පහළ

මණ්ඩලය සඳහා ආසන 338න් 100 දෙනෙක් (29.6%) ස්ත්‍රීන් තේරී පත් විය (Inter Parlimentary Union Open Data,2021).

1994 වසරේ දී බෙල්ජියම මැතිවරණ පනතක් සම්මත කරමින් නාම යෝජනා ලැයිස්තුවලින් 2/3 කට වඩා ස්ත්‍රීන් හෝ පුරුෂයන් ඇතුළත් නොවිය යුතු බවට තිරණය කළේය. එම නීතිය මගින් දෙපාර්ශවය සඳහා ම නාම යෝජනාවලින් ලැබිය යුතු අවම ප්‍රතිශතය නියම කෙරුණි. 1999 දී පැවති යුරෝපා පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් ජර්මනිය මෙම ක්‍රමය භාවිතයට ගැණුනු අතර, එහි දී 18.5%ක් ව පැවති ස්ත්‍රී නියෝජනය 23.3% දක්වා යම් වැඩිවීමක් සිදු විය. 2014 දී බෙල්ජියමේ පැවති මැතිවරණයෙන් පහළ මන්ත්‍රී මණ්ඩලය (Lower or Single House) සඳහා ස්ත්‍රීන් 57 දෙනෙක් තේරී පත් වු අතර, එය 38.0%ක ප්‍රතිශතයකි. ඉහළ මණ්ඩලයේ (Upper Chamber) එම ප්‍රතිශතය 50% දක්වා වර්ධනය වු අතර තේරී පත් වු නියෝජිතවරියන් ගණන 30 කි (Inter Parliamentary Union Report ,2018).

ඔස්ට්‍රේලියාවේ ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමට අදාළ ප්‍රගතිශීලි උපක්‍රම භාවිතා කිරීම වාමාංශික පක්ෂවල මැදිහත්වීමෙන් සිදු විය. නමුත් දක්ෂිනාංෂික පක්ෂ ස්ත්‍රීන් හා සම්බන්ධ පෞද්ගලික ගුණාංග වන නායකත්ව හැකියාව, පුහුණුව හා දැනුම වර්ධනය කිරීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කෙරුණි. 1994 දී කම්කරු පක්ෂය සිය අභිමතාර්ථය ලෙස 2002 වසර වන විට 35%ක ස්ත්‍රී නියෝජනයක් පක්ෂය විසින් පාර්ලිමේන්තුවෙහි නියෝජනය කළ යුතු බව ප්‍රකාශ කළේය. ඒ සඳහා අවශ්‍ය නායකත්වය කාමන් ලෝරන්ස් ලබා දුණි. ස්ත්‍රීන් නියෝජනය වීමට නම් ස්ත්‍රීන් ම තෝරා ගත යුතු බව කාමන් තර්ක කළේය. 1995 වන විට කම්කරු පක්ෂයේ ක්වීන්ස්ලන්ත ශාඛාවේ ක්‍රියාකාරීන් පිරිසක් ඕස්ට්‍රේලියානු ස්ත්‍රී පක්ෂය නමින් පක්ෂයක් පිහිටුවා ගනිමින් උක්ත කරුණට අදාළව කම්කරු පක්ෂයට බලපෑම් කළේය. මෙයට අමතරව 1981 දී කම්කරු පක්ෂය විසින් ස්ත්‍රීන්ගේ තත්ත්වය පිලිබඳ කමිටුව (Federal Parliamentary Labour Party Status of Women Committee) හරහා ස්ත්‍රීන්ට අදාළ නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණයෙහි යෙදුණි. ස්ත්‍රී මැතිවරණ උපදේශන කණ්ඩායම (Women's Electoral Lobby) වැනි ඕස්ට්‍රේලියානු ස්ත්‍රීවාදී ව්‍යාපාර ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කරමින් ඕස්ට්‍රේලියානු පක්ෂවලට බලපෑම් කළහ. ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමට අවශ්‍ය විශේෂිත ආයතන ස්ථාපිත කිරීම, ස්ත්‍රීන් සම්බන්ධයෙන් වන මෙම ගැටලුව කෙරෙහි සමාජය දැනුවත් කිරීම, ස්ත්‍රී නියෝජන ගැටලුව විසදීම සඳහා පක්ෂ නායකයින්ට යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම හා දේශපාලන නායකත්ව පුහුණු වීම් ස්ත්‍රීන්ට ලබා දීම වැනි ක්‍රියාමාර්ග ඒ අතර ප්‍රධාන විය. ඕස්ට්‍රේලියානු දේශපාලන පක්ෂ හඳුන්වාදෙන ලද මෙම ප්‍රතිපත්ති හා ස්ත්‍රීවාදී ව්‍යාපාරවල බලපෑම මත ස්ත්‍රී තියෝජනය යම් මට්ටමක වර්ධනය වී තිබේ. 2016 වන විට ඕස්ට්‍රේලියානු පහළ මණ්ඩලයේ (Lower or Single House) ආසන 150න් 43ක් ස්ත්‍රීන් නියෝජනය වු අතර, එය 28.7% ප්‍රතිශතයකි. ඉහළ මණ්ඩලයේ (Upper Chamber) ආසන 76න් 37ක් ස්ත්‍රීන් නියෝජනය විය. එය ප්‍රතිශතයක් ලෙස 40.8% කි (Inter Parliamentary Union Report ,2018).

## 5.6. ආසියා හා පැසිපික් කලාපීය රටවල පංගු ක්‍රමය භාවිතය

ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීමේ උපක්‍රමයක් ලෙස පංගු ක්‍රමය ආසියා හා පැසිපික් කලාපීය රටවල් විසින් ද භාවිතා කෙරේ. ජාතික දේශපාලනයට සාපේක්ෂව පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය වැඩි කිරීම කෙරෙහි මෙම කලාපීය රටවල අවධානය යොමු කර තිබේ. පංගු ක්‍රම න්‍යාය භාවිතය මඟින් පාළාත් පාලන ව්‍යුහයේ ස්ත්‍රී නියෝජනය ඉහළ මට්ටමකට ගෙන එන ලද රටවල් අතර ඉන්දියාව මූලික වේ. පංගු ක්‍රමය පිළිබඳ මූලික කතිකාවත ඉන්දියාවේ ආරම්භ වෙන්නේ 1920 ගණන්වලය. එම අවධියේ අධිරාජ්‍ය විරෝධී ඉන්දියානු ජාතික ව්‍යාපාර ඉන්දියානු ස්ත්‍රීන්ට ද දේශපාලනය තුළ නියෝජනය වීමේ අයිතියක් ඇති බවට අදහස් ප්‍රකාශ කර ඇත. අධිරාජ්‍ය පාලනය යටතේ එම ඉල්ලීමට සාර්ථක පිළිතුරක් නොලැබීම මත ස්ත්‍රී නියෝජන අයිතිය සම්බන්ධ කතිකාව යටපත් වන අතර, යළි එය පශ්චාත් යටත් විජිත යුගයේ දී ඉස්මතු වේ. 1974 වර්ෂයේ දී ඉන්දියානු ස්ත්‍රීන්ගේ තත්ත්වය සොයා බැලීමට කමිටුවක් පත් කෙරුණි. එම කමිටු වාර්තාවට අනුව දේශපාලන නියෝජිත ආයතන සඳහා අවම වශයෙන් 1/3 ක ප්‍රමාණයක් ස්ත්‍රීන් ඇතුළත් කර ගැනීමට ඉන්දියානු රජය පියවර ගත යුතු බවට නිර්දේශ ඉදිරිපත් කළේය. මෙම පසුබිම මත ඉන්දියානු ස්ත්‍රීවාදී ව්‍යාපාර හා සිවිල් සංවිධාන පළාත් පාලන මට්ටමින් හෝ ස්ත්‍රීන් සඳහා පංගුවක් වෙන් කිරීම අවශ්‍ය බවට තර්ක ඉදිරිපත් කළහ. පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රී නියෝජනය ඉතා අවම මට්ටමක පවතින බව පක්ෂ නායකයන්, පාර්ලිමේන්තු නියෝජිතයන් මෙන් ම සිවිල් සමාජය ද දැනුවත් කිරීමේ කාර්ය ස්ත්‍රී සංවිධාන විසින් සිදු කරන ලදී. ඒ සඳහා සාකච්ඡා කිරීම, රැස්වීම් පැවැත්වීම, අධ්‍යයන හරහා වාර්තා ඉදිරිපත් කිරීම වැනි සමකාමී ක්‍රියාමාර්ග මෙන් ම බලපෑම් කිරීම, පෙළපාළි යාම හා උද්ඝෝෂණ පැවැත්වීම වැනි රැඩිකල්වාදී ක්‍රියාමාර්ග ද අනුගමනය කළහ.

1984 දී මහාරාෂ්ට්‍ර ප්‍රාන්තය පළාත් පාලන අයතනවල නියෝජනයෙන් 30%ක ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලදී. නමුත් අනෙක් ප්‍රාන්තවල මෙම ක්‍රමය ක්‍රියාත්මක නොවුණි. එබැවින් මෙය සමස්ත ඉන්දියාවෙහි ම ස්ත්‍රී නියෝජනය වැඩි වීමට බලපෑමක් නොකළ ද පංගු ක්‍රමයක් ඉල්ලීම සඳහා ස්ත්‍රීන් පෙළඹවීමකට හේතු විය. 1970 සිට 1990 දක්වා ඉන්දීය ස්ත්‍රී සංවිධාන දිගින් දිගටම සිදු කළ දැනුවත් කිරීමේ හා උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙස 1993 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් වෙන් කළේය. 1992 දී පමණ ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කළ 73 වැනි සංශෝධනය ද ඉතා වැදගත් වේ. ඒ හරහා පංචායතී රාජ්‍ය ආයතන සඳහා 1/3ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම සිදු විය. මෙම සංශෝධනය යටතේ සියලු ම පංචායත් රාජ්‍යයන්හි ආයතනවල සභාපතිවරුන් සඳහා වෙන්වූ ප්‍රතිශතයෙන් 1/3ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ යුතු වේ. නමුත් එම තනතුරුවලින් පහත් කුල හෝ ගෝත්‍ර සඳහා ප්‍රතිශතයක් වෙන් කර නොතිබුණි. සංශෝධනයට අනුව ස්ත්‍රීන් සඳහා වෙන් කළ ආසනය ඊළඟ මැතිවරණයේ දී පොදු ආසනයක් ලෙස නම් කරන අතර, ඒ හරහා ආධුනික ස්ත්‍රීන් දේශපාලන ක්‍රමය වෙත හුරුපුරුදු කිරීමටත්, අත්දැකීම්, නායකත්වය වැනි ගුණාංග වර්ධනය කර ගැනීමටත් අවසානයේ ප්‍රායෝගික දේශපාලන තරඟය වෙත යොමු කරවීමටත් අපේක්ෂා කෙරුණි (ලියනගේ,2012).

ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු 2000 වසරේදී පැවැත් වූ දෙවැනි පළාත් පාලන මැතිවරණයට අනුව ග්‍රාම පංචායන්හි ස්ත්‍රී නියෝජනය 31.37%ක් බවට පත්විය. දිස්ත්‍රික් පංචායන්හි එම ප්‍රතිශතය 31.80% දක්වා වර්ධනය විණි. සමස්තයක් ලෙස පළාත් පාලන

ආයතනවල 1993 ව්‍යවස්ථා සංශෝධනයට පෙර 4.5% පමණ වූ ස්ත්‍රී නියෝජනය 2010 වන විට 33-48% දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි. එසේ ඉන්දියානු පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය ඉතා ප්‍රගතිශීලී වර්ධනයක් පෙන්නුම් කළ ද ජාතික දේශපාලනය තුළ එම මට්ටම ඉතා දුර්වලය. 2014 පැවති පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පහළ මණ්ඩලයේ (Lower or Single House) ආයතන 542න් ආසන 64ක් සඳහා ස්ත්‍රීන් තේරීපත් වුණි. එය ප්‍රතිශතයක් ලෙස 11.8% කි. 2018 පැවති මැතිවරණයෙන් එරට සෙනෙට් සභාව (Upper Chamber) සඳහා වූ ආසන 237න් 27ක් ස්ත්‍රීන් නියෝජනය විය. ප්‍රතිශතයක් ලෙස එය 11.4% කි (Inter Parliamentary Union Report ,2018).

පංගු ක්‍රමය භාවිතය පකිස්ථානයට නව ප්‍රවණතාවයක් නොවේ. 1956 සිට ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ජාතික මෙන් ම ප්‍රාන්ත මට්ටමෙන් ස්ත්‍රීන් සඳහා 5-10% ප්‍රතිශතයක් වෙන් කර තිබුණි. නමුත් එය සැලකිය යුතු ප්‍රමාණයක් නොවුණි. එසේ ම වෙන් කළ ආසනවලට නියෝජිතයන් තෝරාපත් කර ගනු ලැබුවේ වක්‍ර ඡන්ද ක්‍රමයක් මඟිනි. වක්‍ර ඡන්ද ක්‍රමය මගින් සිදු කරනු ලැබුවේ වෙන් කළ ආසනවලට ස්ත්‍රීන් තේරීම, මැතිවරණයෙන් තේරීපත් වූ මන්ත්‍රීවරුන් විසින් සිදු කිරීමයි. 1988 වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා නියම කරන ලද ආසන වෙන් කිරීමේ ක්‍රමය නතර කළ අතර එය ස්ත්‍රී නියෝජනය සැලකිය යුතු මට්ටමකින් පහළ වැටීමට හේතු විය. 1993 මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය 10%ක් පමණ වූ අතර 1997 මැතිවරණයෙන් පසු ජාතික ව්‍යවස්ථාදායකය තුළ ද ස්ත්‍රී නියෝජනය 4% වඩා අවම මට්ටමක් දක්වා පහත වැටුණි. මෙම පසුබිම මත ස්ත්‍රීන්ගේ නියෝජනය ප්‍රමාණාත්මකව ඉහළ නංවා ගැනීම සඳහා දේශලපාලන නායකත්වයට බලපෑම් කිරිමේ වගකීම සමස්ත පකිස්ථාන ස්ත්‍රීන් සතු කාර්යභාරයක් බව ස්ත්‍රීවාදී සංවිධාන විසින් හඳුනාගනු ලැබිණි. ඒ අනුව ස්ත්‍රීන්ගේ දේශපාලන අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා වන ප්‍රගතිශීලී ප්‍රතිපත්ති නිර්මාණය සඳහා ජාතික නායකත්වය දැනුවත් කිරීම වෙනුවෙන් විවිධ ක්‍රියාමාර්ග වෙත යොමු වීමට පකිස්ථාන ස්ත්‍රී සංවිධාන කටයුතු කළාය.

ස්ත්‍රී සංවිධාන, ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස් හා නිර්දේශ පිළිබඳ ව අවධානය යොමු කළ පකිස්ථාන රජය විසින් 1997, 1998, 2002 යන වසරවලදී වාර්තා කිහිපයක් ඉදිරිපත් කරන ලදී. එම වාර්තා මඟින් ස්ත්‍රීන්ගේ නියෝජන හිමිකම හා අවශ්‍යතාව තහවුරු කළේය. විශේෂයෙන් 2001 දී සම්මත කරන ලද බලය බෙදීමේ ප්‍රතිපත්තිය යටතේ ජාතික හා පළාත් පාලන ආයතන සඳහා 33%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ අතර, ඔවුන් ඍජු මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතු බවට වන නිර්දේශ ඉදිරිපත් කෙරුණි. බලය බෙදීම පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හඳුන්වා දීමට පෙර පකිස්ථානයේ දේශපාලනය ධනවත් සහ ප්‍රභූ පුරුෂාධිපත්‍යයට පමණක් කේන්ද්‍ර ගත වී තිබුණ ද පංගු ක්‍රම න්‍යාය බලාත්මක වීමත් සමඟ එතෙක් පුරුෂයන්ට පමණක් සීමා වී පැවති නියෝජන ක්‍රමය ස්ත්‍රීන්ට ද විවෘත විය. ග්‍රාමීය හා පහත් කුල යැයි සම්මත ස්ත්‍රීන්ට ද මෙම ක්‍රමය හරහා දේශපාලනයට ප්‍රවිශ්ට වීමේ ඉඩ ප්‍රස්ථාව හිමිවීම වැදගත් වූවකි. පංගු ක්‍රමය මඟින් නියෝජිත ආයතන සඳහා තේරීපත් වූ ස්ත්‍රීන්ගෙන් 57%ක වැඩි ප්‍රමාණයක් වයස අවුරුදු 50ට වඩා අඩු තරුණ පිරිසක්ය. එය තරුණ ජව සම්පන්න නායකත්වය දේශපාලනය වෙත යොමු වීමක් ලෙස සැලකිය හැකි ය (ලියනගේ,2012).

පංගු ක්‍රම න්‍යාය හඳුන්වාදීම දේශපාලනික ව්‍යුහයේ පමණක් නොව සමාජ ප්‍රපංචයේ ද යම් යම් ධනාත්මක වෙනස්කම් ඇති වීමට හේතු විය. එතෙක් සාම්ප්‍රදායිකව ගෘහයේ වැඩ

කටයුතුවලට පමණක් සීමා වී සිටි ස්ත්‍රීහු සමාජයේ පොදු වැඩ කටයුතුවලට ද සම්බන්ධ වූහ. ස්ත්‍රීය නායකත්වය හා වගකීම් දැරීමටත් සුදුසුය යන ආකල්පය සමාජගත වීම ද සිදු වුණි.. එසේ වුවත් දේශපාලන ආයතන සඳහා තේරී පත් වූ නියෝජිතවරියන් ගෙන් වැඩි දෙනෙකු සතුව ඉහළ අධ්‍යාපන මට්ටමක් හෝ දේශපාලනික වශයෙන් පුළුල් දැනුමක් මෙන් ම අත්දැකීම් ප්‍රමාණවත් නොවීම මත ස්ත්‍රී නියෝජනය තුළින් අපේක්ෂා කළ ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි විය. ස්ත්‍රී ජාතික ව්‍යාපාරය විසින් 2001 දී සිදු කරන ලද බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස ජාතික මට්ටමේ නියෝජිත ආයතන සඳහා ද ස්ත්‍රීන් වෙනුවෙන් යම් ප්‍රතිශතයක් වෙන් කිරීම කරන ලදී. ස්ත්‍රී ජාතික ව්‍යාපාරය ජාතික මට්ටමේ නියෝජිත ආයතන සඳහා 33%ක පංගුවක් ස්ත්‍රීන්ට ලබා දිය යුතු බවට ඉල්ලීම් ඉදිරිපත් කළාය. එහි ප්‍රතිඵලයක් ලෙස පකිස්ථාන ප්‍රධාන දේශපාලන පක්ෂ දහයට වැඩි ප්‍රමාණයක් ජාතික හා ප්‍රාන්ත මැතිවරණවලදී නාම යෝජනා ලැයිස්තුවෙන් 30%ක් ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කිරීමට එකඟ විය. ඒ අනුව පකිස්ථානයේ ජාතික බියුරෝව විසින් සෙනෙට් මණ්ඩලය සඳහා 17%ක ප්‍රතිශතයක් ද ජාතික මණ්ඩල සඳහා 18%ක ප්‍රතිශතයක් ද වෙන් කරන ලදී. වර්තමාන පකිස්ථාන ජාතික ඇසෙම්බ්ලිය සඳහා තෝරා ගනු ලබන නියෝජිතවරියන් 60 දෙනා තෝරා ගනු ලබන්නේ සමානුපාතික මැතිවරණ ක්‍රමයට අනුවය. එහි දී එක් එක් පක්ෂය මැතිවරණයෙන් ලබා ගත් ඡන්ද ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ස්ත්‍රීන් සඳහා වෙන් කළ ආසන බෙදා දීම සිදු කෙරේ. මෙම ක්‍රමය සම්බන්ධයෙන් එරට ස්ත්‍රීවාදී ව්‍යාපාර එතරම් ප්‍රසාදයක් නොදක්වයි. එම ස්ත්‍රී ව්‍යාපාර පෙන්වා දෙන්නේ මෙම ක්‍රමය මඟින් තවදුරටත් දේශපාලනය තුළ පුරුෂාධිපත්‍යය තහවුරු වන බවත්, එය ස්ත්‍රීන් අප්‍රධාන තත්ත්වයට පත්වන මෙන් ම බල රහිත රූකඩයක් බවට පරිවර්තනය වන ක්‍රමයක් වන බවයි. මෙයට විසඳුමක් ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ දැනට පකිස්ථානයේ පවතින විශාල ප්‍රමාණයේ හා සාමාන්‍ය ප්‍රමාණයේ ඡන්ද කොට්ඨාස දෙකක් ඒකාබද්ධ කර එය විශේෂ ඡන්ද කොට්ඨාසක් ලෙස නම් කළ යුතු බවයි. එසේ නම් කරන විශේෂ ඡන්ද කොට්ඨාස සඳහා ස්ත්‍රීන් වෙනුවෙන් වෙන ම ආසන වෙන් කිරීම සිදු කළ යුතු බවත් එම ආසන වෙනුවෙන් නාම යෝජනා ලැයිස්තු ඉදිරිපත් කිරීමේ දී ස්ත්‍රීන් සඳහා වෙන ම ලැයිස්තුවක් හා පොදු අපේක්ෂක ලැයිස්තුවක් ද ඉදිරිපත් කළ යුතු ය. ඒ මගින් එම ආසනවල ඡන්ද දායකයන්ට මනාප දෙකක් ලබා දීමට සලස්වා ඉන් එක් මනාපයක් ස්ත්‍රී නියෝජිතවරියන් තෝරා පත් කර ගැනීමට ද අනෙක් මනාපය පොදු ලැයිස්තුවෙන් ඉදිරිපත්වන අපෙක්ෂකයෙකු තෝරා ගැනීමට ද භාවිතා කළ යුතු ය.

පකිස්ථානයේ 2018 දී පැවති මැතිවරණ ප්‍රතිඵලවලට අනුව ජාතික ඇසෙම්බලිය සඳහා ආසන 341න් 69ක් ස්ත්‍රී නියෝජිතවරියන් තේරීපත් වූ අතර එය 20.2% ප්‍රතිශතයකි. දෙවන මණ්ඩලයේ (Upper Chamber) ආසන 104න් 20 දෙනෙක් ස්ත්‍රීන් නියෝජනය විය. එය 19.2% ප්‍රතිශතයකි (Inter Parliamentary Union Report ,2018). ආරම්භක යුගයට වඩා අද වන විට පකිස්ථාන ජාතික හා පළාත් පාලන ආයතනයන්හී ස්ත්‍රීන් සඳහා වූ නියෝජනය යම් මට්ටමක ඉහළ අගයක් පෙන්නුම් කරයි. ඒ සඳහා ස්ත්‍රීවාදී ව්‍යාපාර විසින් ගෙන ගිය ක්‍රියාමාර්ග මූලික වශයෙන් හේතු විය.

බංගලාදේශය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික දේශපාලනයෙහි ස්ත්‍රීන් නියෝජනය විය යුතු ය යන අදහසින් පාර්ලිමේන්තුවේ ආසනවලින් යම් ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කෙරුණි. ජාතික පාර්ලිමේන්තුවේ ආසන 315න් 15ක් එසේ ස්ත්‍රී ආසන ලෙස වෙන් කළ අතර, පසු ව 1976 ව්‍යවස්ථා සංශෝධනය මඟින් එය ආසන 30ක් දක්වා වැඩි කිරීමට කටයුතු කළේය. මෙම වෙන් කරන ලද ආසන සඳහා නියෝජිතවරියන් තෝරාගනු

ලැබුවේ වක්‍ර ඡන්ද ක්‍රමය යටතේ ඡන්ද විද්‍යාලයක් මඟිනි. නමුත් මෙම ක්‍රමය 1987 දී පමණ ඉවත් කෙරුණි. මෙම පසුබිම මත බංගලාදේශ ස්ත්‍රී සංවිධාන රැස්වීම් සංවිධාන කරමින් පෙත්සම් ඉදිරිපත් කරමින් හා සම්මන්ත්‍රණ සාකච්ඡා මඟින් ස්ත්‍රී නියෝජනය පුළුල් කළ යුතු බවට වන යෝජනා ආණ්ඩුවට ඉදිරිපත් කළේය (ලියනගේ,2012).

1. පරිපාලන ඒකක නියෝජනය වන පරිදි සෑම පරිපාලන ඒකකයකට ම එක් නියෝජිතවරිය බැගින් පත් කිරීම

(බංගලාදේශයේ පරිපාලන ඒකක 64 ට අදාළව)

2. වක්‍ර ඡන්ද ක්‍රමය වෙනුවට එම නියෝජිතවරියන් සෘජු මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම.

මෙම ප්‍රධාන ඉල්ලීම් දෙකට අමතර ව දේශපාලන පක්ෂ විසින් නාම යෝජනාවලින් 10-20% ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම අවශ්‍ය බව ද පෙන්වා දුනි. ස්ත්‍රී සංවිධාන විසින් සිදුකළ මෙම බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස 1990 ව්‍යවස්ථා සංශෝධනය මඟින් එතෙක් 1987 දී නවතා දැමූ ආසන බෙදා වෙන් කිරීමේ ප්‍රතිපත්තිය තවත් වසර 10ක් දක්වා දීර්ඝ කළේය. නමුත් 2001 මැතිවරණය වන විටත් වෙන් කරන ලද ආසන සඳහා නියෝජිතවරියක් තේරී පත් වූයේ වක්‍ර ඡන්ද ක්‍රමයෙනි. එසේ තේරී පත් වූ ස්ත්‍රීන් පවා කිසි විටෙකවත් වක්‍ර ඡන්ද ක්‍රමය ප්‍රතික්ෂේප නොකළාය. ඒ සඳහා බලපෑ හේතුව ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ සෘජු ඡන්ද ක්‍රමයකට ප්‍රවේශ වීම යනු ස්ත්‍රීන් තුළ පවා අනවශ්‍ය බල තරගයක් ඉස්මතුවීමට මඟ පාදවන්නක් බවයි. තව ද එය දේශපාලන ප්‍රචණ්ඩත්වයට මඟ විවර කරන කරුණක් ද විය හැකි බව පෙන්වා දුනි. ස්ත්‍රී සංවිධානයන්හි බලපෑම මත ආරම්භයේ සිට ම බංගලාදේශය තුළ ස්ත්‍රී නියෝජනය යම් මට්ටමක වර්ධනයක් පෙන්නුම් කරයි. 2.5%ක් ව පැවති ස්ත්‍රී නියෝජනය 2008 මැතිවරණය වනවිට 19.7% දක්වා වර්ධනය වීමක් සිදු විය. 2014 පැවති මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පාර්ලිමේන්තු ආසන 350න් 71 දෙනෙක් නියෝජිතවරියන් ලෙස තේරී පත් වූහ.

මේ ආකාරයෙන් බංගලාදේශයේ ජාතික දේශපාලන ආයතනයන්හි ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව වර්ධනය වුවත් එයින් අපේක්ෂිත ප්‍රතිඵල ඉටු නොවුණ බව විද්වතුන්ගේ තර්කය වී ඇත. එහි දී ඔවුන් ඉදිරිපත් කරන කරුණු කිහිපයකි.

1. ස්ත්‍රීන් සඳහා ආසන බෙදා වෙන් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රායෝගිකත්වයට නොගැළපීම

මෙහි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා දේශපාලන බලය අතර පවතින අන්තර් සබැඳියාව පිළිබඳ අවබෝධයෙන් තොර ව සංකේතාත්මකව පමණක් ස්ත්‍රීන් දේශපාලනය වෙත සම්බන්ධ කර ගැනීම නිසා දේශපාලනය තුළ ස්ත්‍රීන්ට සැබෑ නියෝජනයක් හිමි නොවුණි.

2. ව්‍යවස්ථාදායක කාර්යයන්වලදී හා තීරණ ගන්නා මට්ටම්වලදී නියෝජිතවරියගේ භූමිකාව පුරුෂාධිපත්‍යයට නතු වීම

වෙන් කරන ලද ආසන සඳහා වක්‍ර ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතවරියන් කිසිදු අවස්ථාවක පුරුෂාධිපත්‍යයට විරුද්ධව හෝ අභියෝගයක් වන අයුරින් ව්‍යවස්ථාදායකය තුළ ක්‍රියා නොකළාය. ඇතැම් අවස්ථාවල නියෝජිතවරියන් හුරු කළ පිරිසක් ලෙස කටයුතු කළ අතර ජාතික මට්ටමේ වැදගත් ප්‍රතිපත්ති කරුණුවලදී නියෝජිතවරියන්ගේ අදහස් කෙරෙහි වැඩි සැලකිල්ලක් නොදැක්වීම ද සිදු විය. මේ හරහා ස්ත්‍රීන් ව්‍යවස්ථාදායකය තුළ

නාමික භූමිකාවට සමාන භූමියක් රඟ දැක්වූ බවට ස්ත්‍රී සංවිධාන විසින් විවේචන එල්ල කරන ලදී.

3. පොදු අරමුණක් කරා දේශපාලන නායකත්වය කේන්ද්‍ර ගත කර ගැනීමට ස්ත්‍රී සංවිධාන අපොහොසත් වීම

ස්ත්‍රී සංවිධාන ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් හඬක් නැගුව ද එය සමස්ත සමාජය ම ඒකරාශී කර ගැනීමට තරම් ශක්තිමත් නොවීය. දේශපාලන පක්ෂවල දේශපාලන නායකයින් හා නියෝජිතවරියන්, සිවිල් සංවිධාන පොදු අරමුණක් වෙත කේන්ද්‍ර ගත කර ගැනීමට අපොහොසත් වීම හරහා ස්ත්‍රී සංවිධාන අපේක්ෂා කළ අරමුණ වෙත ළඟා වීමට නොහැකි විය.

එසේ වුවත් බංගලාදේශයේ පළාත් පාලන ආයතනවල ස්ත්‍රීන්ගේ නියෝජනය යම් මට්ටමකින් වර්ධනය වීම ප්‍රාදේශිය හා ග්‍රාමීය ස්ත්‍රියගේ සමාජ තත්ත්වය ගුණාත්මක අයුරින් වෙනස්වීම කෙරෙහි ද බලපෑම් කළ බව චෞද්රි පෙන්වා දෙයි. එහි දී සාම්ප්‍රදායිකව ගෘහස්ථ භූමිකාවලට පමණක් සීමා වී සිටි ස්ත්‍රිය ඉන් ඉවත්ව සමාජ කාර්යයන්වලට සම්බන්ධ වීම සිදු වූ අතර පුරුෂ මූලික වූ දේශපාලනය ස්ත්‍රීන් වෙනුවෙන් විවෘත වීමත් ඒ සඳහා ආකල්පමය වෙනසක් ස්ත්‍රීන් තුළ ඇති වීම ද හඳුනාගත හැකි ය.

නේපාලයේ 1997 දී පළාත් පාලන ස්වයං පාලන පනත මඟින් ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීමට අදාළ පියවර ගැනුණි. ඊට පෙර 1990 සිට පක්ෂ විසින් ජාතික මැතිවරණවලට ඉදිරිපත් කරනු ලබන නාමයෝජනාවලින් ස්ත්‍රීන් සඳහා 5%ක් වෙන් කිරීමට කටයුතු කෙරුණි. නමුත් එය ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා ප්‍රබල දායකත්වයක් නොවීය. 1997 ස්වයං පාලන පනත බලාත්මක කිරීමෙන් පසු ව සෑම ග්‍රාම සංවර්ධන කමිටුවකටම එක් නියෝජිතවරියක් වෙන් කෙරුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 1997 පළාත් පාලන මැතිවරණය අවසන් වන විට පාළත් පාලන ආයතන සඳහා 30%ක පමණ ප්‍රමාණයක් නියෝජිතවරියන් ලෙස තේරී පත් විය.

නේපාලය විසින් 2007 වසරේදී භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දෙන ලදී. එම ව්‍යවස්ථාවට ස්ත්‍රී පුරුෂ සමානාත්මකතාවය ප්‍රමුඛ කරගත් නියෝජන ක්‍රමයක් සඳහා පංගු ක්‍රමයක ඇතුළත් කළ යුතු ය යන අදහස සමාජ සංවිධාන හා පුද්ගලයින් විසින් ඉදිරිපත් කළහ. ඒ අනුව සරල බහුතර නියෝජන ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය ඒකාබද්ධ මිශ්‍ර නියෝජන ක්‍රමයක් හඳුන්වා දීමට භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කටයුතු කෙරුණි. විශේෂයෙන් 2007 මැතිවරණ පනතේ 7 (4) වගන්තියෙන් ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ සංයුතිය පිළිබඳ ව කරුණු අන්තර්ගත වූ අතර 7 (3) වගන්තිය මඟින් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ඉදිරිපත් කරන ආවෘත ලැයිස්තුවලින් 50%ක ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ යුතු බවට දක්වා තිබුණි. මෙම පසුබිම මත මිශ්‍ර නියෝජනය යටතේ 2008 දී පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී සරල බහුතර නියෝජන ක්‍රමය යටතේ තරග කළ ආසන 240න් 30ක් ජයග්‍රහණය කිරීම ස්ත්‍රීන්ට හැකි විය. සමානුපාතික ක්‍රමය යටතේ වූ 335න් ආසන 161ක් ද ජයග්‍රහණය කළාය. එමෙන් ම ජාතික ලැයිස්තුවට කාන්තා නියෝජිතවරියන් 6 දෙනෙකු ද තේරී පත්විය. නේපාල මැතිවරණ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාන නියෝජනය සඳහා පදනම සැපයීම 2008 මැතිවරණය මඟින් සිදුවීම සුවිශේෂී කරුණක් ලෙසින් හඳුනා ගත හැකි ය. මෙම මැතිවරණයේ දී තේරී පත් වූ සියලු කාන්තා නියෝජිතවරියන් නේපාල සමාජ

ප්‍රපංචයේ විවිධ සමාජ ස්ථරයෙන් නියෝජනය කරන පිරිසක් වීම ද තවත් කැපී පෙනෙන ලක්ෂණයකි. භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පංගු ක්‍රමය හඳුන්වා දෙමින් නේපාලය තුළ ස්ත්‍රී නියෝජනය ඉහළ මට්ටමකට ගෙන ඒමට දැමූ පදනමෙහි සාර්ථකත්වය වර්තමානය වන විට ද දැකිය හැකිය (ලියනගේ,2012). 2017 වසරේ නේපාලයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵල අධ්‍යයනය කිරීමේ දී පහළ මණ්ඩලය (Lower or Single House) සඳහා වන ආසන 275න් 90ක් ස්ත්‍රී නියෝජිතවරියන් තේරී පත් වූ අතර දෙවන මණ්ඩලය (Upper Chamber) වෙනුවෙන් 2018 පෙබරවාරි පැවති ඡන්ද විමසීමේ දී ආසන 59න් 22ක් ම ස්ත්‍රීන් තේරී පත් විය (Inter Parliamentary Union Report ,2018).

ආසියානු කලාපීය අනෙකුත් රටවල් හා බැලීමේදී ජාතික දේශපාලන ආයතනවල 32-33% අතර ප්‍රමාණයක් ස්ත්‍රීන් නියෝජනය වීම නේපාල ස්ත්‍රීන් ලැබූ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය. එසේ වුවත් පිතෘ මූලික සමාජ හා සංස්කෘතික ලක්ෂණ සාම්ප්‍රදායික ආකල්ප, පිළිගැනීම් මෙන් ම දේශපාලනික වශයෙන් ස්ත්‍රීන් සතු දැනුම හා අත්දැකීම් අඩුවීම සහ ප්‍රචණ්ඩ දේශපාලන සංස්කෘතිය නිසා තවදුරටත් සක්‍රීය නියෝජිතවරියන් ලෙස දේශපාලන තරගයට අවතීර්ණ වීම අභියෝගයක් වී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන කිහිපයක අවධානය හා මඟ පෙන්වීම මත පශ්චාත් යුධ සමයේ ඇෆ්ගනිස්ථානය විසින් සම්පාදනය කළ ව්‍යවස්ථාව සඳහා ස්ත්‍රී නියෝජනය පිළිබඳ විධිවිධාන ද ඇතුළත් කරන ලදී. 2001 වසරේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය හා මැදිහත්වීම මත ඇෆ්ගනිස්ථානය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා වන පීටර්ස්බර්ග් සමුළුව පැවැත්විණි. තලේබාන් කැරලි කරුවන්ගේ යුධ ගැටුම් නිසාවෙන් පීඩාවට පත් වන ස්ත්‍රීන් හා ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව මෙහි දී විශේෂ අවධානයක් යොමු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රී නියෝජනය තහවුරු කිරීමට එකඟත්වය පළ කෙරුණි. ඇෆ්ගනිස්ථානයේ 2004 දී සම්පාදනය කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩල නියෝජනයේ දී 25%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. දෙවන මණ්ඩලය සඳහා විධායකය විසින් පත් කරන නියෝජිතයන් අතරින් 17%ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් නියෝජනය විය යුතු බවට ව්‍යවස්ථාවේ සඳහන් විය. ඒ අනුව 2010 පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ දී පහළ මණ්ඩලයේ (Lower or Single House) ආසන 249න් 69 දෙනෙක් නියෝජිතවරියන් ලෙස තේරී පත් වූවාය. 2011 පැවති දෙවන මණ්ඩලය (Upper Chamber) තෝරා ගැනීම සඳහා වූ මැතිවරණයෙන් මුළු ආසන 102න් 28ක් ස්ත්‍රීන් නියෝජනය විය. එමෙන් ම 2015 වසරේදී දෙවන මණ්ඩලය සඳහා වූ මැතිවරණයෙන් 19ක් (මුළු ආසන 68) ස්ත්‍රීන් තේරී පත් විය.

### 5.7. පංගු ක්‍රමය සම්බන්ධයෙන් ලාංකික අත්දැකීම්

ආසියානු රටවල් අතරින් පළමුවරට සර්වජන ඡන්ද බලය ලාංකික ස්ත්‍රීන්ට හිමි වුවත් ජාතික හා පළාත් පාලන ආයතනවල ඇගේ නියෝජනය ඉතා දුර්වලය. ඉන්දියාව, බංගලාදේශය, නේපාලය හා පකිස්ථානය වැනි කළාපීය අනෙකුත් රටවල ස්ත්‍රී නියෝජනය සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වීම පිණිස එම රටවල දේශපාලන පක්ෂ, ස්ත්‍රී නියෝජිතවරියන්, ස්ත්‍රීවාදී ව්‍යාපාර විසින් මෙහෙය වූ විවිධ ඉල්ලීම් හා අරගල බෙහෙවින් හේතු විය. නමුත් ලාංකික ස්ත්‍රීන්ගේ නියෝජන අයිතිය පුළුල් කිරීම උදෙසා ජාතික මට්ටමින් හඬ නැගූ ව්‍යාපාර හෝ ස්ත්‍රීන් ලාංකික දේශපාලනය තුළ විරලය. එබැවින් පංගු ක්‍රමය සම්බන්ධ දීගු

අත්දැකීම් සහිත ඉතිහාසයක් ලාංකිකයන්ට නොමැත.

ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය ගැටලුවට විසඳුමක් ලෙස පංගු ක්‍රමයක අවශ්‍යතාව පිළිබඳ ව අදහස් ඉදිරිපත් වූ අවස්ථා කිහිපයක් මෑත කාලීන ලාංකික දේශපාලන ඉතිහාසය තුළින් හමුවේ. ස්ත්‍රීන්ට යම් ප්‍රතිශතයක් වෙන් කළ යුතු ය යන අදහස පළමුවරට 1970 දශකයේ මැද භාගයේ දී පමණ ඇතැම් ස්ත්‍රී සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු ක්‍රියාකාරීන් විසින් එවකට දේශපාලන ධාරාවේ සිටි දේශපාලන පක්ෂ හා රජයන් වෙත ඉදිරිපත් කරන ලදී. නමුත් එහි සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගැනීමට ඔවුන් අසමත් විය. එසේ ම මැතිවරණ ක්‍රම සංශෝධනය පිළිබඳ ව සොයා බැලීමට 2003 වසරේ දී පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිහිට වූ අතර, එම සභාවට ද ස්ත්‍රී සංවිධාන ඇතුළු ක්‍රියාකාරින් විසින් වනිතා කටයුතු අමාත්‍යාංශයේ ද සහයෙන් ස්ත්‍රී නියෝජනයට අදාළ ව යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. පසු ව 2011 දී පමණ පංගුවක් වෙන් කිරීම සම්බන්ධ යෝජනාවක් එවකට කාන්තා කටයුතුභාර අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ ද එම යෝජනාව ද ප්‍රතික්ෂේප විය. නැවත වරක් 2012 දී පමණ පළාත් පාලන නියෝජන ක්‍රම සංශෝධන පනතට 25%ක නාම යෝජනා ප්‍රතිශතයක් ඇතුළත් කර ගැනීමට උත්සාහ ගනු ලැබුව ද එය ද ව්‍යයර්ථ විය. මේ අයුරින් ස්ත්‍රීන් වෙනුවෙන් පංගුවක් වෙන් කිරීම වෙනුවෙන් අවස්ථා කිහිපයක දී ගත් උත්සාහයන් බිඳ වැටීම කෙරෙහි විවිධ දේශපාලන පක්ෂ නායකයන්ගේ පසුගාමී අදහස්, ආකල්ප හා පුරුෂාධිකාරී දේශපාලන පරිසරයේ ස්වභාවය ද බලපෑවේය.

කෙසේ වුවත් යම් යම් කාලපරිච්ඡේදයන්හි විටින් විට පංගු ක්‍රමය පිළිබඳ ව දේශපාලන ප්‍රවාහය තුළ මතු වූ කතිකාවන්හි ප්‍රතිඵලයක් ලෙස 2017 දී පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය 25%ක් විය යුතු ය බවට වන 2017 අංක (16) දරන පළාත් පාලන (සංශෝධන) කෙටුම් පත පාර්ලිමේන්තුවේ දී සම්මත විය. එය සර්ව ජන ඡන්දබලය හිමිවීමෙන් වසර අනූවකට පසු ව ලාංකික ස්ත්‍රීන් ලැබූ ජයග්‍රහණයක් වශයෙන් සඳහන් කළ හැකි ය.

එසේ 2017 වසරේ අගෝස්තු මස සම්මත කර ගනු ලැබූ නව (සංශෝධන) පනතට අනුව ස්ත්‍රීන් සඳහා හඳුන්වාදුන් පංගු ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න මෙහි දී අවධානයට යොමු කළ යුතු ය. නව මැතිවරණ ක්‍රමය යටතේ පළාත් පාලන ආයතන සඳහා පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා ලැයිස්තුව කොටස් දෙකකින් සමන්විත යුතු වේ එනම්,

1. කොට්ඨාසවල තරඟ කරන ලැයිස්තුව හා
2. සමානුපාතික පදනමින් තරඟ කරන (අතිරේක ලැයිස්තුව) වශයෙනි.

පළාත් පාලන ආයතනයක සිටිය යුතු කොට්ඨාස මට්ටමේ සභික සංඛ්‍යාව ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ සිටින මුළු සභික සංඛ්‍යාවෙන් 60%ක් වශයෙන් ගෙන කොට්ඨාස ලැයිස්තුව ද ඉතිරි 40% ප්‍රමාණය සඳහා අමතර පුද්ගලයන්ගේ ආවරණය වන පරිදි අතිරේක ලැයිස්තුව ද සකස් කෙරේ. මෙම ලැයිස්තු දෙකෙහි ම එකතුවෙන් පළාත් පාලන ආයතනයක මුළු සංයුතිය සකස් කරනු ලැබේ. එහි දී කොට්ඨාසවල තරඟ කරන අපේක්ෂක නාම යෝජනා ලැයිස්තුවේ ස්ත්‍රීන්ට අවම වශයෙන් 10%ක් ද හා අතිරේක ලැයිස්තුවෙන් අවමය 50%ක් ද වශයෙන් ස්ත්‍රීන් නියෝජනය විය යුතු ය. මැතිවරණයෙන් පසු කොට්ඨාස ගණනාවකින් සමන්විත වන පළාත් පාලන ප්‍රදේශය තුළ අදාළ දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් ලබා ඇති මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 20% වඩා අඩුවෙන් ඡන්ද ලබා

ගත් හා සභිකයන් තිදෙනෙකු හෝ ඊට අඩුවෙන් ලබා ගත් පක්ෂවල ඡන්ද ප්‍රමාණයන් ඉවත් කොට ඉතිරි ඡන්ද ප්‍රමාණය අදාළ පළාත් පාලන ආයතන සඳහා තේරී පත්විය යුතු අවම කාන්තා මන්ත්‍රීධූර සංඛ්‍යාවෙන් (25%ක සභික සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවෙන්) බෙදීමෙන් පසු ලැබෙන අගයන් එම ඡන්ද සංඛ්‍යාවට අදාළ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව බෙදීමෙන් එක් එක් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් පත් කළ යුතු කාන්තා සභික සංඛ්‍යාව තිරණය කරනු ලැබේ. එසේ කාන්තා සභිකයන් තිරණය කිරීම නිදසුනක් ආශ්‍රයයෙන් තවදුරටත් පැහැදිලි කළ හැකි ය

නිදසුන් : 01 (X නම් ප්‍රදේශීය සභාවට අදාළ ව ප්‍රකාශිත ප්‍රතිඵල මත පදනම්ව එක් එක් දේශපාලන පක්ෂ විසින් ලබා ගත් ඡන්ද ප්‍රතිශත හා ආසන ප්‍රමාණය පහත පරිදි දැක්විය හැකි ය.)

| පක්ෂය | ලබා ගත් ඡන්ද සංඛ්‍යාව | මුළු වලංගු ඡන්ද සංඛ්‍යාව | ඡන්ද ප්‍රතිශතය | දිනා ගත් ආසන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| A | 27938 | 57540 | 48.55 | 13 |
| B | 23274 | 57540 | 40.44 | 10 |
| C | 6327 | 57540 | 10.99 | 03 |

මෙහි දී ස්ත්‍රී නියෝජනය පිළිබඳ ව සලකා බැලීම පිණිස අදාළ කර ගනු ලබන්නේ A සහ B යන පක්ෂ විසින් ලබා ගත් ඡන්ද ප්‍රමාණය පමණි.

A, B පක්ෂ ලබා ගත් ඡන්ද ප්‍රමාණයේ එකතුව - 27938 + 23274

25% සමාන සභික සංඛ්‍යාව (26/4) - 6.5

තීරක අගය (51212/6.5) - 7878.76

A පක්ෂය විසින් පත් කළ යුතු ස්ත්‍රී නියෝජිත සංඛ්‍යාව

(27938/7878.76) - 3.5 (දශම ස්ථාන පූර්ණ සංඛ්‍යාවට වැටයූ පසු 03 කි.)

B පක්ෂය විසින් පත් කළ යුතු ස්ත්‍රී නියෝජිත සංඛ්‍යාව

(23274/7878.76) - 2.95 (දශම ස්ථාන පූර්ණ සංඛ්‍යාවට වැටයූ පසු 02 කි.)

එසේ ම යම් පළාත් පාලන ආයතනයක කාන්තා සභිකයෙකු සම්බන්ධයෙන් පුරප්පාඩුවක් ඇති වූ විට තේරී පත් වී ඇති හෝ 9 වන වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති පළමු නාමයෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් කාන්තා අපේක්ෂිකාවක් නම් කිරීම හරහා එම පුරප්පාඩුව පිරවිය හැකි බව පනතේ 66ආ වගන්තියෙන් පැහැදිලි කර ඇත (2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත).

මෙම නව මැතිවරණ ක්‍රමය යටතේ පළමුවරට 2018 පෙබරවාරි 10 වන දින පළාත් පාලන මැතිවරණය පැවැත්විය. මහනගර සභා 24ක්, නගර සභා 40ක් හා ප්‍රදේශීය සභා 276ක් වශයෙන් සමස්ත ආසන 340 කින් නියෝජිතයන් 8356 දෙනෙකු තෝරා පත් කර ගැනීමට නියමිත විණි. මැතිවරණය සඳහා අපේක්ෂකයින් 57252 දෙදෙනෙකු පමණ ඉදිරිපත් විය. එයින් නියෝජිතයන් ලෙසින් 8324ක් තේරී පත් වූ අතර ඉන් 1919 දෙනෙක් කාන්තාවෝ වූහ. මැතිවරණයේ දී පළාත් පාලන ආයතන 340න් 325ක් සඳහා ම 25%ක ස්ත්‍රී නියෝජන තහවුරු වීම ලාංකික ස්ත්‍රීන් ලැබූ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය. එය 95% ඉක්මවූ ප්‍රතිශතයකි. විශේෂයෙන් 25% ප්‍රතිශතයක් නොමැති වූයේ ආසන 15කට පමණි. ඒවා ද බහුතරය උතුරු නැගෙනහිරට අයත් ය.

මෙම මැතිවරණයෙන් පසු ව ඒ ඒ පළාත් පාලන ආයතන සඳහා 25% ස්ත්‍රී නියෝජිතවරින් තෝරා පත් කිරීමේ දී යම් යම් ප්‍රයෝගික ගැටළුවලට මුහුණපෑමට ද සිදු විය. කෙසේ වුවත් නීතිමය වශයෙන් ස්ත්‍රීන් වෙනුවෙන් යම් පංගුවක් වෙන් වීම මෙරට කාන්තා දේශපාලනයේ යම් සාධනීය පරිවර්තනයකට මඟ විවර වීමක් ලෙස සැලකිය හැකි ය.

## 5.8. ලතින් ඇමරිකානු රටවල පංගු ක්‍රමය භාවිතය

විසිවන සියවසේ අවසාන භාගයේ පමණ වන විට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම සංකල්පය වැඩි යාමත් සමඟ ගොඩනැගෙන නව දේශපාලන සංස්කෘතික ලක්ෂණ ලතින් ඇමරිකානු කලාපීය රටවලට ව්‍යාප්ත විය. එහි එක් ප්‍රතිඵලයක් වූයේ ස්ත්‍රී පුරුෂ සමාන නියෝජනය ඇති කිරීම සඳහා වන පංගු ක්‍රම න්‍යාය කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කිරීමයි. ලතින් ඇමරිකානු කලාපීය රටවල් අතරින් ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමය හඳුන්වා දුන් පළමු රට වන්නේ ආජන්ටිනාවයි. 1991 වන විට ස්ත්‍රී නියෝජන අවශ්‍යතාවය වෙනුවෙන් ස්ත්‍රීවාදී ව්‍යාපාර නැගී සිටීම හා දේශපාලන පක්ෂ විසින් එම අවශ්‍යතාවය පිළිගැනීම යන කරුණු මත පදනම්ව 30%ක පංගු ක්‍රමයක් හඳුන්වා දීම සිදු වුණි. ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද මැතිවරණ පනතට අනුව පක්ෂ නාමයෝජනා ලැයිස්තු සකස් කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමතුලිතතාවය ආරක්ෂා වන අයුරින් සිදු කළ යුතු විය. එහි දී ජාතික මැතිවරණවලට ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තුවලින් 30%ක් ස්ත්‍රී නියෝජනය වීම අනිවාර්ය වන අතර, එසේ නොවන නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කිරීම ද සිදු කෙරුණි. පංගු ක්‍රමය න්‍යාය භාවිතයට පෙර විශේෂයෙන් 1991 වන විට ආජන්ටිනාවේ ස්ත්‍රී නියෝජනය 4.6%ක පමණ අවම මට්ටම පැවතුණි (ලියනගේ,2012). නමුත් පංගු ක්‍රම න්‍යාය භාවිතය තුළින් ව්‍යවස්ථාදායකයෙහි ස්ත්‍රී නියෝජනය ප්‍රතිශතය 1993-2003 කාල පරාසයේ දී 21.3%-30.7% දක්වා වර්ධනය වීමක් සිදුවිය. 2017 වසරේදී පැවැත් වූ මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පහළ මණ්ඩලයේ (Lower or Single House) ආසන 100ක් (මුළු ආසන 257න්) ජයග්‍රහණය කිරීමට ස්ත්‍රීන්ට හැකි වූ අතර එය ප්‍රතිශතයක් ලෙස 38.9% ක ප්‍රමාණයකි. දෙවන මණ්ඩලය (Upper Chamber) සඳහා ආසන 30ක් (මුළු ආසන 72න්) ප්‍රමාණයක් ස්ත්‍රී නියෝජනය කළ අතර එය 14.7%ක ඉහළ ප්‍රතිශතයකි (Inter Parliamentary Union Report,2018).

පේරු, පැරගුවේ හා මෙක්සිකෝව පංගු ක්‍රමය භාවිතා කරන රටවල් ලෙස සැලකේ. ආජන්ටිනාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරවල ආභාෂය ලැබීමත් සමඟ මෙම රටවල ජාතික ස්ත්‍රීවාදය ශක්තිමත් වීම පංගු ක්‍රමයේ ව්‍යාප්තියට හේතු විය. පේරු රාජ්‍යයේ පංගු ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා එරට පුජිමෝරි ජනාධිපතිවරයා විසින් සිදු කළ ප්‍රතිසංස්කරණ ඉතා වැදගත් වේ. පාර්ලිමේන්තු ස්ත්‍රී කොමිසමක් පිහිටුවීම, ස්ත්‍රීන් සඳහා පාර්ලිමේන්තු

කොමසාරිස්වරයෙකු පත් කිරීම මෙන් ම ස්ත්‍රීන් මුහුණ දෙන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහිව නීති පැනවීමට ද ඔහුගේ මැදිහත් වීමෙන් සිදු කළේය (ලියනගේ,2012). 1997 වන විට 30% පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට අදාළ නීති සම්මත කර ගැනුණි. පංගු ක්‍රමය හඳුන්වා දීම මත 1998 වනවිට ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රී නියෝජනය 18% දක්වා වර්ධනය විය. නමුත් විවෘත ලැයිස්තු ක්‍රමය යටතේ නාම යෝජනා ලැයිස්තුවල ස්ත්‍රීන්ගේ නම් අගට ඇතුළත් කිරීම් නිසා පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් ඡන්ද ලබා ගැනීමේ හැකියාව අවම විය. 2016 වසරේ පැවැති මැතිවරණයෙන් ආසන 36ක් (මුළු ආසන 130න්) ස්ත්‍රී අපේක්ෂිකාවන් ජයග්‍රහණය කළාය. එය 27.7% ප්‍රතිශතයකි (Inter Parliamentary Union Report,2018).

1996 වසරේදී පැරගුවේ රාජ්‍යය ද 20%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. එහි දී ආජන්ටිනාව මෙන් ආවෘත නාම යෝජනා ලැයිස්තු ක්‍රමය භාවිතා කෙරුණි. පැරගුවේ 2018 පැවැති මැතිවරණයෙන් පහළ මණ්ඩලයේ (Lower or Single House) ආසන 80න් 12ක් ජයග්‍රහණය කිරීමට ද දෙවන මණ්ඩලයේ (Upper Chamber) ආසන 45න් 8ක් ජය ගැනීමට ද ස්ත්‍රීන්ට හැකියාව ලැබුණි (Inter Parlimentary Union Open Data,2021).

1996 දී මොක්සිකෝව ද පංගු ක්‍රමය භාවිතා කරමින් 30%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස 2018 පැවැති මැතිවරණයෙන් පහළ මණ්ඩලය (Lower or Single House) තුළ 48.2% ස්ත්‍රීන් නියෝජනය වූ අතර දෙවන මණ්ඩලයේ (Upper Chamber) එය 49.2% පමණ විය (Inter Parliamentary Union Report,2018). මෙම රටවලට අමතරව බොලිවියා ආවෘත ක්‍රමය යටතේ 30%ක පංගුවක් ද විවෘත ලැයිස්තු ක්‍රමය යටතේ බ්‍රසිලය 30%ක පංගුවක් ද ආවෘත ලැස්තු ක්‍රමය යටතේ කොස්ටරිකා 40%ක පංගුවක් ද ස්ත්‍රීන් සඳහා වෙන්කර තිබේ.

මේ අයුරින් ලතින් ඇමරිකානු රටවල ස්ත්‍රී නියෝජනය සඳහා පංගු ක්‍රම න්‍යාය ජනප්‍රිය වීම කෙරෙහි එම රටවල දේශපාලන පක්ෂ සතු නම්‍යශීලී භාවය හා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ මෙන් ම ස්ත්‍රී සංවිධාන විසින් ගෙන ගිය සටන් ව්‍යාපාරය ද ප්‍රබල ලෙස හේතු විය. විශේෂයෙන් පංගු ක්‍රමය භාවිතා කිරීම සම්බන්ධයෙන් අනෙකුත් කලාපීය රටවල්ට වඩා අත්දැකීම් රැසක් ලතින් ඇමරිකානු රටවලට පවතී. ඒ අතරින් අර්ජන්ටිනාව, ඉක්වදෝරය හා කොස්ටරිකා රටවල ස්ත්‍රී නියෝජනය ප්‍රතිශතය 30% ඉක්මවා ඇත. ඒ සඳහා බලපෑ කරුණු කිහිපයක් පිළිබඳ මාලා හටින් (Mala Htun) හා මාක්ජ ජෝන්ස් විසින් පෙන්වා දෙයි.

1. ආවෘත ලැයිස්තු ක්‍රමය

ආවෘත ලැයිස්තු ක්‍රමය යටතේ ඉදිරිපත් කළ නම් හා පිළිවෙළ මැතිවරණයකින් පසු වෙනස් කිරීමට නොහැකි වීම මත ස්ත්‍රීන්ට වන අසාධාරණය වැළැක්වුණි.

2. ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම සඳහා පංගු ක්‍රමය භාවිතා කිරීම සංකේතාත්මකව නොව ප්‍රායෝගික ලෙස අවබෝධ කර ගනිමින් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් කටයුතු කිරීම.

3. ස්ත්‍රී ව්‍යාපාරයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග.

පීතෘ මූලික සමාජ ක්‍රමය හා පුරුෂාධිපත්‍යය කේන්ද්‍රගත වූ දේශපාලන ක්‍රමය යටතේ

ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ගිලිහි යාම හා සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකා වෙනස් කිරීම යන කරුණු සම්බන්ධයෙන් මෙම රටවල ස්ත්‍රී සංවිධාන නැගී සිටි අතර, දේශපාලන ක්ෂේත්‍රයේ දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීමට සම නියෝජනය සඳහා දේශපාලන නායකත්වය සමඟ ගැටෙමින් කටයුතු කෙරුණි. දේශන පැවැත්වීම, සාකච්ඡා කිරීම, අධ්‍යයනයන් සිදු කර වාර්තා ඉදිරිපත් කිරීම වැනි සමකාමී ක්‍රියා මාර්ග පමණක් නොව උද්ඝෝෂණ පැවැත්වීම, පෙළපාලි යාම, ආදී රැඩිකල් ක්‍රියාමාර්ග හරහා බලපෑම් කිරීම මගින් ඉල්ලීම් දිනා ගැනීම සඳහා කටයුතු කෙරුණි.

## 5.9. අප්‍රිකානු හා අරාබි රටවල පංගු ක්‍රමය භාවිතය

අප්‍රිකානු රටවල ස්ත්‍රී නියෝජනය සංකල්පය වැඩි යාම සඳහා ස්ත්‍රීවාදී සංවිධාන මෙහෙය වූ අරගල බෙහෙවින් හේතු විය. ඇතැම් අප්‍රිකානු රටවල පැවති යුධ වාතාවරණය යටතේ කාන්තා හා ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වීම සිදු වුණි. කාන්තාවන් හා දරුවන් පීඩාවට පත්කිරීමට විරුද්ධව පොදු අරමුණක් වෙත කේන්ද්‍රගත වෙමින් අප්‍රිකානු රටවල ස්ත්‍රීන් සිය අයිතීන් වෙනුවෙන් බලපෑම් කිරීමට පෙළඹුණි. මෙම රටවල යුද ගැටළු නිමාවීමත් සමඟ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ප්‍රධාන පෙළේ රටවල් ලබාදුණි. එහි දී ස්ත්‍රී නියෝජනය වෙනුවෙන් ස්ත්‍රීවාදී සංවිධාන විසින් ඉල්ලීම් ඉදිරිපත් වූ අතර ඒ සඳහා ඇතැම් රටවල් එකඟවෙමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ දී ස්ත්‍රී නියෝජනයට අවශ්‍ය මූලධර්ම ද ඇතුළත් කෙරුණි. පශ්චාත් යුද සමයෙන් පසු රුවැන්ඩාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා ස්ත්‍රීවාදී ව්‍යාපාර විසින් සිදු කළ බලපෑම් ද හේතු විය. එසේ සම්පාදනය කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9(4) වගන්තියෙන් තීරණගන්නා මට්ටම්වලදී 30% ස්ත්‍රී නියෝජනය විය යුතු බවට සඳහන් වේ. ඒ අනුව රුවන්ඩා පාර්ලිමේන්තුවේ පළමු මණ්ඩලයේ ආසන 80න් 24ක් ද දෙවන මණ්ඩලයේ ආසන 20න් 6ක් ද ස්ත්‍රීන් සඳහා වෙන්විය යුතු ය. ආරම්භයේ දී 30% ස්ත්‍රීන් නියෝජනය වුවත් අද වන විට පාර්ලිමේන්තුවලින් ඉහළ ම ස්ත්‍රී නියෝජනයක් වන රට වශයෙන් රුවන්ඩාව හැඳින්විය හැකි ය. 2018 වසරේ පැවැත්වූ මැතිවරණට අනුව පහළ මණ්ඩලයෙන් (Lower or Single House) ආසන 80න් 49ක් ද දෙවන මණ්ඩලයේ (Upper Chamber) ආසන 26න් 10ක් වශයෙන් ස්ත්‍රී නියෝජිතවරියන් තේරී පත් විය. (Inter Parliamentary Union Report,2018).

ඇතැම් රටවල ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව වර්ධනය වුවත් නියෝජනය සංකල්පය තුළින් අපේක්ෂා කළ සාධනීය ලක්ෂණ ළඟා කර ගත නොහැකි වුණි.

නමුත් ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව පමණක් නොව ගුණාත්මකව ද වර්ධනය කර ගැනීමට රුවන්ඩාවට හැකියාව ලැබිණි. රුවන්ඩා පාර්ලිමේන්තුවට තේරිපත් වූ නියෝජිතවරියන් ස්ත්‍රීන් හා ළමුන් මුහුණ දෙන ගැටලු වෙනුවෙන් පෙනී සිටි අතර ස්ත්‍රීන්ගේ සුබසාධනය වෙනුවෙන් ප්‍රගතිශීලී ප්‍රතිපත්තිය ද හඳුන්වා දුනි.

පශ්චාත් යුද සමයේ ඉරාකයෙහි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් ගොඩ නැගීම පිණිස ස්ත්‍රීන් විසින් ද දායකත්වය සපයන ලදී. ඉරාකයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ දී ව්‍යවස්ථානුකූලව ස්ත්‍රී නියෝජන තහවුරු කළ යුතු බවට එරට ස්ත්‍රීහු ඉල්ලීම් ඉදිරිපත් කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස සම්පාදනය කරන ලද නව ව්‍යවස්ථාවේ 49 වැනි වගන්තියෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සඳහා 25%ක නොඅඩු පංගුවක් ඇතුළත් විය යුතු බවට වන විධිවිධානයක් ඇතුළත් කළේය. 2018 පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පහළ

මණ්ඩලයේ (Lower or Single House) ආසන 329න් 83ක් ස්ත්‍රී නියෝජනය විය (Inter Parliamentary Union Report,2018).

ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මකව වර්ධනය කරගත් තවත් රටක් ලෙස දකුණු අප්‍රිකාව දැක්විය හැකි ය. 1996 ට පෙර පැවති පාලන කාලය තුළ 2.8%ක පමණ අඩු මට්ටක ස්ත්‍රී නියෝජනය පැවතුනත් 1994න් පසු එය සාධනීය මට්ටමින් වෙනස් වේ. 2009 මැතිවරණය වන විට සමස්ත පාර්ලිමේන්තුව ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය 42.3% බවට පත් විය. ස්ත්‍රී නියෝජනයේ රැඩිකල් වෙනසක් දකුණු අප්‍රිකාවේ ඇති වීම සම්බන්ධයෙන් බලපෑ සාධක කීපයකි.

1. ස්ත්‍රී සංවිධාන හා ස්ත්‍රීන් විසින් නිදහස හා අයිතිවාසිකම් වෙනුවෙන් දියත් කළ සටන් ව්‍යාපාර

2. දේශපාලන නායකත්වය, ස්ත්‍රි නියෝජනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා දේශපාලනය බලය අතර පැවතින සැබැඳියාව හඳුනා ගනිමින් කටයුතු කිරීම

දකුණු අප්‍රිකානු ජාතික කොංග්‍රසයේ නායක නෙල්සන් මැන්ඩෙලා ස්ත්‍රී අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත්, සියලු තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රීන්ගේ නියෝජනය තහවුරු කිරීමටත් අදාළ ප්‍රතිපත්ති හඳුන්වා දීමට කටයුතු කළේය. විශේෂයෙන් එම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමත් ස්ත්‍රී නියෝජනය සාධනීය ලෙස ඉහළ යෑමට හේතු විය. දකුණු අප්‍රිකාවේ 1996 දී නව ව්‍යවස්ථා සම්පාදන කටයුතුවලට ස්ත්‍රීන්ගේ ජාතික සභාග (Womenes National coalition Compaingn) ව්‍යාපාරය කේන්ද්‍ර කරගත් ස්ත්‍රීහු ස්ත්‍රී අයිතිවාසිකම් තහවුරු කිරීමට බලපෑම් කළහ. 1994 දී ජාතික කොංග්‍රසයේ මූලිකත්වයෙන් පිහිටු වූ ආණ්ඩුව එවකට ස්ත්‍රීන්ගේ සුභසාධනය හා ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අදාළ වැඩසටහන් රාශියක් හඳුන්වා දුනි. එහි දී 1994 වසරේදී පමණ ස්ත්‍රීන් බලගැන්වීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළේය. 1995 වන විට ස්ත්‍රීන් බල ගැන්වීමට අදාළ නව ව්‍යාපෘතියක් හඳුන්වා දෙමින් රජයේ කටයුතුවලට දායකත්වය ලබා ගත්හ. 1993 දී පාර්ලිමේන්තු නියෝජිතවරයන්ගේ මූලිකත්වයෙන් ස්ත්‍රීන් සම්බන්ධයෙන් වු වාර්තාවක් සකස් කර බෙයිජිං සමුළුව සඳහා ඉදිරිපත් කෙරුණි (ලියනගේ,2012). එහි දී ස්ත්‍රීන් සමාජ, ආර්ථික හා දේශපාලන අංශයන්හි භුක්ති විඳින අසමාන අයිතිවාසිකම් ස්ත්‍රීන් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය හා හිංසනය වැනි කරුණු කෙරෙහි අවධානය යොමු විය. මෙම සමුළුවෙන් පසු ව දකුණු අප්‍රිකාවේ ස්ත්‍රීන්ගේ තත්ත්වය, සමාජ ගරුත්වය හා අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා වැඩ වැඩසටහන් සංවිධානය කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 1997 දී පාර්ලිමේන්තු පනතක් මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව තහවුරු කිරීම සඳහා ජාතික කොමිසමක් ආරම්භ කෙරුණි. දකුණු අප්‍රිකාව තුළ ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම් සඳහා ආරම්භයේ ජාතික කොංග්‍රස් පක්ෂය මූලිකත්වය ගෙන කටයුතු කළේය. ජාතික කොංග්‍රසය නාමයෝජනාවලින් 33.3%ක පංගුවක් ස්ත්‍රීන්ට වෙන් කිරීම මගින් අනෙකුත් පක්ෂ තුළ ද ස්ත්‍රීන් වෙනුවෙන් පංගු ක්‍රමයක් සඳහා යොමුවක් ඇති විය. එහි බලපෑම් මත 2006 දී පමණ දේශපාලන ක්ෂේත්‍රයේ සමාන අයිතිවාසිකම් ඉල්ලා සටන් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස දකුණු අප්‍රිකාවේ අනෙකුත් දේශපාලන පක්ෂ ද ස්ත්‍රීන් සඳහා නාමයෝජනාවලින් 20-30% පංගුවක් වෙන් කිරීමට කටයුතු කෙරුණි. 2014 දී පැවති මැතිවරණයේ දී පහළ මණ්ඩලයේ (Lower or Single House) ආසන 393න් 168ක් හා දෙවන මණ්ඩලයේ (Upper Chamber) ආසන 54න් 19ක් ස්ත්‍රීහු නියෝජනය වූහ (Inter

Parliamentary Union Report,2018).

ජෝර්දානය, මොරොක්කෝව යන රටවල ද යම් ප්‍රමාණයක ස්ත්‍රීන් වෙනුවෙන් නියෝජන අවස්ථා හිමිකර දී ඇත. 2001 වසරේදී පැවති මැතිවරණ නීති සංශෝධනයට ලක් කර පහළ මණ්ඩලයේ ආසන 110න් 6ක් පමණ ස්ත්‍රීන් සඳහා වෙන් කළ අතර එම ආසනවලින් ඉහළ ඡන්ද ප්‍රමාණයක් හිමිකර ජයග්‍රහණය කළ අපේක්ෂිකාව ජෝර්දානයේ රජු විසින් නියෝජිතවරියක් ලෙස පත් කරනු ලැබේ. මේ නීතිය මත පදනම්ව 2003 වසරේ පැවති මැතිවරණයේ දී 5.0%ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් දිනාගත් අතර, 2010 වන විට එය 10.8% දක්වා ද වැඩි විය. 2016 වසරේදී පැවති මැතිවරණයේ දී පහළ මණ්ඩලය (Lower or Single House) සඳහා ආසන 130න් 20ක් හා දෙවන මණ්ඩලයේ (Upper Chamber) ආසන 65න් 10ක් ජයග්‍රහණය කළහ.

මොරොක්කෝවෙහි ද ආරම්භයේ දී ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය අඩු මට්ටමක පැවතුනි. 2002 වසර වන විට පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 10.8% වූ අතර, 2011 වන විට එය 17.0% දක්වා වර්ධනය විය. 2016 වන විට පහළ මණ්ඩලයේ (Lower or Single House) ආසන 81ක් (මුළු ආසන 395න්) හා දෙවන මණ්ඩලයේ (Upper Chamber) ආසන 14ක් (මුළු ආසන 120න්) ස්ත්‍රීන්ට දිනා ගැනීමට හැකියාව ලැබිණි (Inter Parliamentary Union Report,2018). මෙම රටවලට අමතර ව බහරේන් පහළ මණ්ඩලේ 15.0% හා ඉහළ මණ්ඩලයේ 22.5%ක් ද කුවේට් 3.1%, ඕමාන් පහළ මණ්ඩලයේ 1.2% හා ඉහළ මණ්ඩලයේ 16.5%, කටාර් 9.8%, ඊජිප්තුව 14.9%, සෞදී අරාබිය 19.9% සහ ඉරාකය 25.2% වශයෙන් ස්ත්‍රීන් සඳහා නියෝජනය අවස්ථා වෙන් කර ඇත (Inter Parliamentary Union Report,2018).

## 5.10. පංගු ක්‍රමය දිනා ගැනීම සඳහා ලෝකයේ විවිධ රටවල් භාවිතා කළ උපක්‍රම

යුරෝපා, ආසියා, අප්‍රිකා හා ලතින් අමෙරිකානු කලාපීය රටවල් බොහොමයක් පංගු ක්‍රම න්‍යාය භාවිතය මඟින් ස්ත්‍රී නියෝජන ප්‍රමාණාත්මක අයුරින් මෙන් ම ගුණාත්මකව ද වර්ධනය කරගෙන තිබේ. එහි දී එම රටවල් පංගු ක්‍රමය දිනා ගැනීම සඳහා යොදාගත් උපක්‍රම රටින් රටට දේශපාලන සංස්කෘතියෙන් සංස්කෘතියට විවිධ වේ. එසේ සාර්ථකව භාවිතා කළ උපක්‍රම අතරින් පොදුවේ හඳුනාගත හැකි කරුණු කිහිපයක් පහත පරිදි වේ.

- ❖ ජාත්‍යන්තර සංවිධාන හා ප්‍රබල රාජ්‍යයන්යන්ගේ මැදිහත් වීමෙන් දේශීය ආණ්ඩුව වෙත බලපෑම් කිරීම.

පංගු ක්‍රමය විවිධ රටවල දේශපාලන ව්‍යුහය වෙත හඳුන්වා දීම කෙරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රමුඛ කර ගත් ජාත්‍යන්තර සංවිධාන හා ප්‍රබල රාජ්‍යයන් විසින් සුවිශේෂී දායකත්වයක් සපයන ලදී. පශ්චාත් යුද වාතාවරණයක් පැවති රටවල ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය කිරීමට අවශ්‍ය පෙළඹවීම හා උපදේශකත්වය මෙම සංවිධාන හා රටවල දායකත්වයෙන් සිදු විය. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ දී ස්ත්‍රී නියෝජනය සහතික කිරීමට අදාළ පංගු ක්‍රම න්‍යාය වැනි විධිවිධාන ඒ සඳහා ඇතුළත් කිරීම කෙරෙහි ද අවධානය යොමු වූණි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1975 දී පමණ ආරම්භ කරන ලද ස්ත්‍රී සමුළු මඟින් ද පංගු ක්‍රමය පිළිබඳ අදහස මූලික වශයෙන් සමාජය තුළ ව්‍යාප්ත වීමට අවශ්‍ය පසුබිම නිර්මාණය විය. 1995 බෙයිජිං ක්‍රියාකාරී වැඩ සැලසුම හරහා එය තවදුරටත් කතිකාවතකට යොමු වන අතර, එහි දී තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රී පුරුෂ සමාන නියෝජනය පිළිබඳ

අදහස පිළිගැනුණි. ස්ත්‍රීන්ගේ නියෝජනය වෙනුවෙන් පංගු ක්‍රමය හඳුන්වාදීම කෙරෙහි ජාත්‍යන්තර සංවිධාන සෘජුව ම දේශීය ආණ්ඩු වෙත බලපෑම් කළ අවස්ථා ද හඳුනාගත හැකි ය. කොසොවෝහි 1999 දී යුධ වාතාවරණය අවසන් වීමෙන් පසු ව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ප්‍රධානත්වයෙන් ප්‍රජාතන්ත්‍රවාදය හා මානව අයිතිවාසිකම් තහවුරු කිරීමේ අරමුණින් භාරකාර කොමිසමක් පිහිටු විය. මෙම කොමිසම විසින් දේශපාලනයේ දී ස්ත්‍රීන් මුහුණ දෙන ප්‍රධාන බාධක කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඡන්ද දායකයින් ලෙස ලියාපදිංචි වීමේ දී ස්ත්‍රීන් හමුවේ ඇති බාධක මෙන් ම මැතිවරණ අපේක්ෂිකාවන් ලෙස ඉදිරිපත් වීමේ දී පවතින අභියෝග එසේ පවතින ප්‍රධාන ගැටලු ලෙස හඳුනා ගැනුණි. ඒ අනුව මෙම කොමිසම 2000 දී පමණ ජාතික හා පළාත් පාලන මට්ටමේ මැතිවරණවලදී නාමයෝජනා ලැයිස්තුවලින් 30%ක ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන් කළ යුතු වන බවට නීතියක් හඳුන්වා දුනි. මෙම නීතිය හඳුන්වා දීමෙන් පසු විවිධ සමාජ හා සංවිධාන ක්‍රියාකාරීන් ඊට විරුද්ධව අදහස් ඉදිරිපත් කළේය. එහි දී විරුද්ධ කණ්ඩායම් පෙන්වා දුන්නේ සමාජයේ ස්ත්‍රීන් දේශපාලනික වශයෙන් සවිඥාණික නොවන බැවින් ඔවුන් තවමත් මැතිවරණ සඳහා ඉදිරිපත් වීමට නුසුදුසු පිරිසක් වන බවයි. එසේ වුවත් රාජ්‍ය නොවන සංවිධාන හා ස්ත්‍රී සංවිධානවල දැඩි කැපවීම හා උනන්දුව මත මෙම විරුද්ධවාදී අදහස් සමඟ සටන් කර ස්ත්‍රී නියෝජන අයිතිය වෙනුවෙන් ගෙන ගිය අරගලය නොනවත්වාම මෙහෙය විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2000 පැවැති මැතිවරණයේ දී දේශපාලන පක්ෂ විසින් නාම යෝජනා ලැයිස්තුවලින් 30%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට කටයුතු කෙරුණි.

යුධ ගැටුම් නිමා වීමෙන් පසු ව ඇෆ්ගනිස්ථානය තුළ 2001 දී පමණ එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වීමෙන් විශේෂ පරිපාලන කොමිසමක් පිහිටුවිය. තලේබාන් කැරලිකරුවන්ගේ යුද ගැටුම් හමුවේ ඇෆ්ගනිස්ථාන ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම් හා ස්ත්‍රීන් පීඩනයට පත් වීම් පිළිබඳ 2001 දී පැවැති පිටර්ස්බර්ග් සමුළුවේ දී මූලික වශයෙන් අවධානයට යොමු කෙරුණී. එහි ප්‍රතිඵලයක් ලෙස ඇෆ්ගනිස්ථාන භාරකාර ආණ්ඩුව තුළ අමාත්‍ය ධූර දෙකක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට පියවර ගැනුණ අතර, පාර්ලිමේන්තුවට ද ස්ත්‍රීන් තිදෙනෙකු පත් කරන ලදී. එසේ ආරම්භ වූ ස්ත්‍රී නියෝජනය පසු ව ක්‍රමයෙන් වර්ධනය විය. සෑම ප්‍රාන්තයකින් ම අවම වශයෙන් එක් මන්ත්‍රීවරියක් හෝ පාර්ලිමේන්තුවට තේරී පත්විය යුතු ය යනුවෙන් විධිවිධානයක් 2004 දී පමණ නව ඇෆ්ගනිස්ථාන ව්‍යවස්ථාවට අන්තර්ගත කිරීමට කටයුතු කිරීම ද වැදගත් පියවරක් ලෙස සැලකිය හැකි ය. එහි දී පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩල නියෝජනයෙන් 25%ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් වූ අතර, ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන දෙවන මණ්ඩලයේ නියෝජිතයන් අතරින් අඩක් ස්ත්‍රීන් ද විය යුතු බවට නීතියෙන් ම සඳහන් කෙරුණි. මේ ආකාරයෙන් අද වන විට ලෝකයේ රටවල් සියයකට ආසන්න ප්‍රමාණයක් පංගු ක්‍රමය හඳුන්වා දී භාවිතා කිරීමටත් තවත් රටවල් විසිපහකට වැඩි ප්‍රමාණයක් ඒ සම්බන්ධයෙන් වූ කතිකාවත් ආරම්භ කිරීම සඳහාත් අවධානය යොමු කර තිබේ. ඒ සඳහා ජාත්‍යන්තර සංවිධාන හා බලවත් රටවල් ඒකාබද්ධව සිදු කරන දායකත්වය ඉතා වැදගත්ය.

❖ ස්ත්‍රී සංවිධාන හා ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්හි නැඟී සිටීම

සංවර්ධිත රටවලටත් වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල ස්ත්‍රී නියෝජනය දිනා ගැනීම වෙනුවෙන් සුවිශේෂී කාර්යයන් රැසක් ඉටු කරන ලද්දේ ස්ත්‍රීවාදී සංවිධානය මූලිකත්වයෙනි. එහි දී ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් ජනතාව ප්‍රාදේශීය හා ජාතික වශයෙන් දැනුවත් කිරීම, දේශන පැවැත්වීම, ස්ත්‍රීන් පිළිබඳ ව විවිධ අධ්‍යයනයන් සිදු කර වාර්තා ඉදිරිපත්

කිරීම, දේශපාලන නායකත්වය සමඟ ඉතා සමීපව කටයුතු කරමින් ඉල්ලීම් හා නිර්දේශ ඉදිරිපත් කිරීම, පමණක් නොව උද්ඝෝෂණ ව්‍යාපාර මෙහෙයවමින් සිය ඉල්ලීම් වෙනුවෙන් බලපෑම් කිරීම, කේවල කිරීම වැනි රැඩිකල් උපක්‍රම ද ස්ත්‍රී සංවිධාන විසින් භාවිතා කරන ලදී. ස්ත්‍රී සංවිධාන හා ස්ත්‍රීවාදී ව්‍යාපාර ඒකාබද්ධව ස්ත්‍රී නියෝජනය වෙනුවෙන් කටයුතු කළ අවස්ථා ගණනාවක් ම හඳුනාගත හැකි ය. 1992 දී ඕස්ට්‍රේලියාවේ දේශපාලන සඳහා වූ ස්ත්‍රීන්ගේ සභාගය පිහිටුවා ජාතික මට්ටමේ දී ස්ත්‍රී නියෝජනය තහවුරු කළ යුතු බවට බලපෑම් කිරීම එයට එක් උදාහරණයකි. මෙම ස්ත්‍රී සභාගය විසින් ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් වන ගැටළු ඉස්මතු කර ඊට කඩිනම් විසඳුම් අපේක්ෂාවෙන් පංගු ක්‍රමයක් ඉල්ලා ඕස්ට්‍රේලියා රජයට ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. ඊට අමතර ව 1970 වන විට ස්ත්‍රීන්ගේ මැතිවරණ උපදේශන ව්‍යාපාරය ස්ත්‍රීන්ගේ අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේ දී නියෝජිතවරියන් දිරි ගැන් වීය. 1990 අවසාන භාගය පමණ වන විට ප්‍රංශයේ පීතෘ මූලික රාජ්‍යයට එරෙහිව ගොඩනැගුණු ප්‍රංශයේ සමානාත්මතා ව්‍යාපාරය ද සුවිශේෂී වේ. මෙම ව්‍යාපාරය ස්ත්‍රීවාදී අදහස් අගය නොකරන කණ්ඩායම් ද ඒකාබද්ධ කර ස්ත්‍රී නියෝජනය සමස්ත ස්ත්‍රීන්ට බලපාන වෙන් වූ මූලධර්මයක් ලෙස සලකා කටයුතු කළේය. වාමාංශික, දක්ෂිණාංශික මෙන් ම මධ්‍යස්ථ මත දරන ස්ත්‍රීන් ද මෙම ව්‍යාපාරය වෙත එකරාශී වීම හරහා දේශපාලන පක්ෂ වෙත නාම යෝජනාවලදී ස්ත්‍රීන් සඳහා පංගුවක් වෙන් කිරීම සඳහා ප්‍රබල බලපෑමක් සිදු කළහ.

මොරොක්කෝවේහි ස්ත්‍රීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සංගමය (Democratic Association of Moroccan Women) එරට ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම වෙනුවෙන් සුවිශේෂී මෙහෙයක් ඉටු කළේය. 2000 දී පමණ ආණ්ඩුව විසින් මැතිවරණ නීති සංශෝධනය කිරීමට පෙළඹුන අවස්ථාවේ ස්ත්‍රීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සංගමය ස්ත්‍රී නියෝජනය අවශ්‍යතාව සම්බන්ධයෙන් ආණ්ඩුව වෙත බලපෑම් කරන ලදී. දේශපාලනයේ දී ස්ත්‍රීන් මුහුණපාන අභියෝග වන නියෝජන අසමානතාවය, දේශපාලන ප්‍රචණ්ඩත්වය වැනි මාතෘකා ගණනාවක් යටතේ විවිධ වැඩසටහන් සංවිධානය කරමින් නිර්දේශ හා යෝජනා නායකයන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරුණි. මෙම ව්‍යාපාරයේ බලපෑම මත පාර්ලිමේන්තුවේ ආසනවලින් 30ක් ජාතික ලැයිස්තුවක් හරහා ලබා දීමට කටයුතු කළ අතර, දේශපාලන පක්ෂ විසින් ද පක්ෂ නාමයෝජනා ලැයිස්තුවලට ස්ත්‍රීන් 4 දෙනෙකුවත් ඇතුළත් කිරීමට එකඟත්වය පළ කරන ලදී. ආරම්භයේ දී මෙය පුරුෂ මූලික පක්ෂ විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුණි. නමුත් පසු ව ස්ත්‍රී නියෝජනය අවශ්‍යතාවයක් ලෙස පිළිගැනීමටත් ඒ සඳහා සහයෝගය ලබා දීමටත් කටයුතු කළේය.

2002 වසර වන විට ස්ත්‍රීන් 35 දෙනෙක් නියෝජනය වු මොරොක්කෝ පාර්ලිමේන්තුවේහි 2018 වනවිට පහළ මණ්ඩලයේ ආසන 395න් 81ක් ම ස්ත්‍රී නියෝජනය විය. ප්‍රතිශතයක් ලෙස එය 20.5% කි. (Inter Parliamentary Union Report,2018). පුරුෂයන් සමඟ ගැටෙමින් ස්ත්‍රීන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ජාතික දේශපාලනය තුළ කටයුතු කිරීම සඳහා නියෝජිතවරියන්ට අදටත් අවස්ථාව උදාවී ඇත්තේ එසේ ස්ත්‍රී සංවිධාන විසින් ගෙන ගිය අරගලයන්හි ප්‍රතිඵලයක් ලෙසිනි.

ඉන්දියානු පීතෘ මූලික දේශපාලනයට එරෙහිව ස්ත්‍රී අයිතීන් වෙනුවෙන් ස්ත්‍රී සංවිධාන විසින් ප්‍රබල භූමිකාවක් රඟ දක්වන ලදී. 1976 දී ඉදිරිපත් වූ කොමිසන් වාර්තාව ඉන්දියානු ව්‍යාපාරයක් දිරි ගැන්වීමට අවශ්‍ය පදනම සැපයුණි. එම වාර්තාව මඟින් ග්‍රාමීය සමාජ ස්ථරායනවල ස්ත්‍රී නියෝජනය තවදුරටත් වර්ධනය කළ යුතු බවටත් ඒ සඳහා අවශ්‍ය

ප්‍රතිපත්ති හඳුන්වාදීමටත් නිර්දේශ කළේය. ඒ අනුව ග්‍රාම පංචයත් පළාත් පාලන ආයතනවල තනතුරු සඳහා 30%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලෙස ස්ත්‍රී සංවිධාන විසින් රජය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළාය. විශේෂයෙන් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 73 සහ 74 සංශෝධන ඉදිරිපත් කිරීමේ දී ජාතික මට්ටමේ ස්ත්‍රී සංවිධාන පළාත් පාලන ආයතන සඳහා 33.3%ක නියෝජනයක් ඉල්ලා සිටියාය. අනෙකුත් රටවල මෙන් ම ඉන්දියානු ස්ත්‍රී ව්‍යාපාර ද සිය අරමුණු ඉටු කර ගැනීම පිණිස විවිධ උපක්‍රම භාවිත කළේය. ග්‍රාමීය, ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් ස්ත්‍රී නියෝජනය පිළිබඳ ව සිවිල් සංවිධාන දැනුවත් කිරීම, දේශපාලනය පිළිබඳ උනන්දුවක් දක්වන ස්ත්‍රීන් සඳහා පුහුණු වැඩමුළු හා දේශන මඟින් බලගැන්වීම, පළාත් හා ජාතික මට්ටමේ නායකයන් සමඟ සාකච්ඡා පැවැත්වීම වැනි උපක්‍රම ඒ අතර විය. ඇතැම් ස්ත්‍රී සංවිධානවල ක්‍රියාකාරීන් දේශපාලන නායකත්වය සමඟ අවිධිමත් සම්බන්ධතා ගොඩනගා ගැනිමට පවා කටයුතු කළ අතර, එවැනි උපක්‍රම මඟින් ද ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙසින් වර්ධනය කිරීම යන පොදු අරමුණ සාධනය කර ගැනීමට කැප වූහ.

පකිස්තානයේ ස්ත්‍රී සංවිධාන ද ස්ත්‍රී නියෝජනය වෙනුවෙන් අරගල කළේය. එහි ආරම්භය වශයෙන් 2000 වසරේදී පමණ පකිස්ථානයේ බලය විමධ්‍යගත කිරීම සඳහා වූ සැලැස්මක් සකස් කරන අවස්ථාවේ දී එරට ස්ත්‍රී සංවිධාන විසින් 33%ක නියෝජනයක් ලබා දෙන මෙන් පැවැති මිලිටරි ආණ්ඩුව වෙත බලපෑම් කරන ලදී. 2001 වන විට ස්ත්‍රී ජාතික ව්‍යාපාරය ජාතික මට්ටමේ නියෝජිත ආයතනවලින් 33%ක් ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කරන ලෙස ඉල්ලා සිටියේය. එහි ප්‍රතිඵලයක් ලෙස පකිස්තානයේ දේශපාලන පක්ෂ බහුතරයක් ප්‍රාන්ත හා ජාතික මැතිවරණවලදී නාමයෝජනාවලින් 30%ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට කටයුතු කෙරුණි.

පකිස්තානය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථකව ක්‍රියාත්මක වීමට නම් දේශපාලන නියෝජනයේ දී ස්ත්‍රී පුරුෂ විෂමතා දුරු කළ යුතු වන බවට ස්ත්‍රී සංවිධාන පෙන්වා දුනි. විශේෂයෙන් ප්‍රාදේශීය දේශපාලනයට සම්බන්ධ වීමට උනන්දුවක් දක්වන ස්ත්‍රීන් වෙනුවෙන් විවිධ වැඩසටහන් සංවිධානය කර පුහුණුවීම් ලබාදීම, ස්ත්‍රීන් බල ගැන්වීමට අදාළ ධාරිතා සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම හා දේශපාලනයේ දී ස්ත්‍රීන් නියෝජනය වීමේ අවශ්‍යතාවය පිළිබඳ පොදු මහජනතාව දැනුවත් කිරීම වැනි ක්‍රියාමාර්ග ස්ත්‍රී සංවිධාන මැදිහත් වීමෙන් සිදු කළේය. එසේ වුව ද ස්ත්‍රීන් සම්බන්ධයෙන් වූ සාම්ප්‍රදායික මතිමතාන්තරවලට හා පිතෘ මූලික සමාජ ක්‍රමයට එරෙහිව නැඟී සිටී ම වෙනුවෙන් පොදු මතයක් ගොඩනැඟීමට පාකිස්තානය සංවිධාන අපොහොසත් වී ඇත.

පංගු ක්‍රමය දිනා ගැනීම සඳහා බංග්ලාදේශය ස්ත්‍රී සංවිධාන විසින් ද සුවිශේෂී කාර්යයක් ඉටු කරන ලදී. 1980 අවසාන භාගය වන විට බංග්ලාදේශයේ ස්ත්‍රී සංවිධාන පංගු ක්‍රමයක් වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් කළාය. එහි දී බංගලාදේශ පරිපාලන ඒකක 64 සඳහා අවම වශයෙන් එක් නියෝජනයක් බැගින් හෝ මහජන ඡන්දයෙන් තෝරා ගත යුතු බවට අදහස් ඉදිරිපත් කෙරුණි. එමෙන් ම දේශපාලන පක්ෂවල නාම යෝජනා ලැයිස්තුවලින් 20%ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලෙස පක්ෂවලින් ඉල්ලා සිටියේය. එසේ වුවත් 1990 බංගලාදේශ නව ව්‍යවස්ථාව සම්පාදනය කරන අවස්ථාවේ දී ස්ත්‍රීන්ගේ මෙම ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු නොවුනි. 1991-2001 මැතිවරණ කාලවලදී බංගලාදේශය ප්‍රධාන ස්ත්‍රී සංවිධාන විශාල ප්‍රමාණයක් මහිලා පර්ෂද් සංවිධානයේ මූලිකත්වයෙන් පංගු ක්‍රමයක් දිනා ගැනීම සඳහා රජයට බලපෑම් කළාය. ස්ත්‍රී නියෝජනයේ අවශ්‍යතාවය පිළිබඳ

මහජනතාව දේශන, සම්මන්ත්‍රණ හා සාකච්ඡා මගින් දැනුවත් කිරීමට පියවර ගැනුණි. එසේ ම පාර්ලිමේන්තු නියෝජිතවරියන් සමඟ ද සම්බන්ධතා ගොඩනගා ගනිමින් කටයුතු කෙරුණි. කෙසේ වුවත් බංගලාදේශ ස්ත්‍රී ව්‍යාපාර අපේක්ෂා කළ ඉලක්ක සාධනය කර ගැනීමට අසමත් විය. මෙහි දී ස්ත්‍රී සංවිධාන විසින් අදහස් මාලාවක් කලින් කලට ඉදිරිපත් කළ ද ඇතැම් කරුණු සම්බන්ධයෙන් ඔවුන් තුළ ද එකගතාවක් නොවීය. ස්ත්‍රීන් සඳහා ආසන වෙන් කළ යුතු බවට ප්‍රකාශ කළත් එය කොපමණ ආසන සංඛ්‍යාවක් ද යන්න පිළිබඳ ව එකගතාවයක් නොවීම ඊට කදිම නිදසුනකි. එසේ ම ස්ත්‍රී සංවිධාන දේශපාලන පක්ෂ නායකයින් හා විවිධ සිවිල් සංවිධාන සමඟ ජාලගත වීම හා සම්බන්ධතා ගොඩනගා නැගීමේ දී ද විධිමත් උපක්‍රමශීලී ආකාරයෙන් කටයුතු කිරීමට ද නොහැකි විය.

මේ ආකාරයෙන් පංගු ක්‍රමය දිනා ගැනීම උදෙසා විවිධ රටවල ස්ත්‍රී සංවිධාන ඒකරාශි වී කටයුතු කළ අතර එහි දී සාමකාමී ක්‍රියාමාර්ග මෙන් ම රැඩිකල්වාදී උපක්‍රම ද අනුගමනය කළහ. එසේ සංවිධානාත්මකව හා විධිමත්ව ස්ත්‍රී සංවිධානය, ස්ත්‍රී ව්‍යාපාර ක්‍රියාත්මක වූ රටවල අනෙකුත් රටවල්වලට සාපේක්ෂව ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය වී ඇත.

- ❖ දේශපාලන පක්ෂ විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග

දේශපාලන පක්ෂ ස්ත්‍රී නියෝජනය පිළිබඳ අනුගමනය කළ ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග ස්ත්‍රී නියෝජනය වර්ධනය වීමට ප්‍රබල හේතුවක් විය. ඇතැම් රටවල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හෝ පනත් මගින් ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවලදී පවා එම රටවල දේශපාලන පක්ෂ විසින් ස්වෙච්ඡාවෙන් පංගු ක්‍රම සඳහා ප්‍රතිපත්ති හඳුන්වා දී ස්ත්‍රීන්ගේ නියෝජන අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් කටයුතු කළේය. විශේෂයෙන් ස්කැන්ඩිනේවියානු රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් නීතියක් මගින් පංගු ක්‍රමය හඳුන්වා දී නොමැත. එසේ වුවත් එම රටවල දේශපාලන පක්ෂ මැදිහත්වීමෙන් මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කර දීමට කටයුතු කර ඇත.

ලෝකයේ බොහෝ රටවල මුල් යුගයේ ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස වර්ධනයක් නොපෙන්වීමට ප්‍රධාන හේතුවක් ලෙස එම රටවල දේශපාලන පක්ෂ විසින් ඒ පිළිබඳ ව අවධානය යොමු නොකිරීම පෙන්වාදිය හැකි බවට ලොවෙන්ඩස්කි හා නොරිස්ගේ (Lovenduski and Norris) අධ්‍යයනයවලින් ප්‍රකාශ වේ. දේශපාලන පක්ෂ ස්ත්‍රීන්ගේ නියෝජනය කෙරෙහි සැලකිය යුතු මට්ටමේ අවධානයක් යොමු නොකිරීම මත 1960 ගණන් වන විට එම රටවල ස්ත්‍රී සංවිධාන සාකච්ඡා, දේශන, සම්මන්ත්‍රන හරහා දේශපාලන පක්ෂ වෙත බලපෑම් කරන ලදී. ඇතැම් ස්ත්‍රී සංවිධාන උද්ඝෝෂණ මෙහෙයවීම, ඡන්දය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම, දේශපාලන පක්ෂ වෙත තර්ජනය කිරීම වැනි රැඩිකල් උපක්‍රම ද අනුගමනය කළේය. එම බලපෑම්වල ප්‍රතිඵලයක් වශයෙන් නෝර්වේ, ස්වීඩනය, නෙදර්ලන්තය, බ්‍රිතාන්‍ය වැනි රටවල දේශපාලන පක්ෂ හා ලතින් ඇමෙරිකානු රටවල සමාජවාදී පක්ෂ සිය පක්ෂවල අභ්‍යන්තර ප්‍රතිපත්ති සංශෝධනය කර ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමය හඳුන්වා දුනි.

1983 දී නෝර්වේ කම්කරු පක්ෂය නාම යෝජනාවලින් 40% ස්ත්‍රී සඳහා වෙන් කෙරුණි. ඉන් පසු ව නෝර්වේ ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, සමාජවාදී පක්ෂය ඇතුළු සෙසු පක්ෂ ද මැතිවරණ නාම යේජනාවලින් පංගුවක් ස්ත්‍රී සඳහා වෙන් කළේය. මෙයට අමතර ව ඩෙන්මාක්හි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ද 1984 දී පමණ 50% ස්ත්‍රී පුරුෂ සමාන

නියෝජන ප්‍රතිපත්තියක් හඳුන්වා දුනි.

ස්වීඩනයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ද 1994 දී නාමයෝජනා ලැයිස්තු සකස් කිරීමේ දී පළමු වැන්නා පුරුෂ අපේක්ෂකයෙකු ද දෙවැන්නා ස්ත්‍රී අපේක්ෂිකාවක් වශයෙන් හඳුන්වා දෙමින් ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමට පියවර ගැණුනි. ජර්මනිය ඇතුළු බටහිර යුරෝපියානු රටවල ද පංගු ක්‍රමය හඳුන්වාදීමේ දී 1980 දී ග්‍රීන් පක්ෂය විසින් නාමයෝජනා ලැයිස්තු සඳහා (Zipper) ක්‍රමය හඳුන්වා දුනි. ජර්මන් ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී විපක්ෂය 1996 දී පක්ෂ අභ්‍යන්තර තනතුරුවලින් හා මැතිවරණ නාම යෝජනාවලින් 30%ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. මේ අයුරින් ලොව විවිධ රටවල දේශපාලන පක්ෂ විසින් අනුගමනය කළ ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග ස්ත්‍රී නියෝජනය වර්ධනය වීම කෙරෙහි ප්‍රබල ලෙස ම බලපෑම් කර ඇත.

❖ විශේෂ ආයතන පිහිටුවීම

දේශපාලන ක්ෂේත්‍රයට පිවිසෙන ආධුනික ස්ත්‍රීන්ට අවශ්‍ය දේශපාලන දැනුම, අත්දැකීම් ලබා දීමේ අරමුණින් විශේෂිත ආයතන පිහිටුවීම ද ස්ත්‍රී නියෝජනය සාධනීය ලෙස වර්ධනය වීම කෙරෙහි බලපෑවේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, පක්ෂ ප්‍රතිපත්ති මගින් ස්ත්‍රී නියෝජනය තහවුරු කිරීමට කටයුතු කළ ද ප්‍රායෝගික දේශපාලනයේ දී ස්ත්‍රීන්ට අවශ්‍ය පළපුරුද්ද, හැකියාව ගොඩනැගීම අවශ්‍ය වේ. ඒ සඳහා බොහෝ රටවල් ප්‍රමාණයක විශේෂ ආයතන පිහිටුවීම මගින් ඊට අවශ්‍ය පසුබිම නිර්මාණය කළේය වික්ටෝරියානු කම්කරු පක්ෂ ස්ත්‍රීන්ගේ ජාලය, ඇමරිකාවේ විෂ් ලැයිස්තුව, ඔස්ට්‍රේලියානු එමිලි ලැයිස්තුව හා ස්වීඩන් ලිබරල් පක්ෂයේ සමාන ඉඩ ප්‍රස්ථා කමිටුව එවැනි විශේෂ ආයතන කිහිපයකි. ආධුනික ඡන්ද අපේක්ෂිකාවන් පුරුදු පුහුණු කිරීම, දේශපාලන නියෝජිතවරියන් සමඟ ඒකාබද්ධව ස්ත්‍රී සුබ සාධනයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට පෙළඹවීම, ස්ත්‍රී අධ්‍යයනයන් හා සමීක්ෂණ මගින් වාර්තා ඉදිරිපත් කිරීම ආදී කාර්යයන් මෙම ආයතන විසින් ඉටු කරන ලදී.

## 6. නිගමනය

ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය පිළිබඳ පුළුල් කතිකාවතක් ඇතිවන්නේ 20 වන සියවසේ දීය. 1995 බෙයිජිං ජාත්‍යන්තර ස්ත්‍රී සමුලුවේදී ප්‍රකාශයට පත් කරන ලද එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී වැඩ සැලැස්ම එහි මුලාරාම්භය ලෙස සැලකේ. සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවලද ව්‍යවස්ථාදායක මණ්ඩලවල ස්ත්‍රීන්ගේ නියෝජන ප්‍රතිශතය 30% ඉක්මවා ගොස් නොමැත. දේශපාලන නියෝජනයේදී පවතින ස්ත්‍රී පුරුෂ අසමානතාවයේ ගැටලුව පිළිබඳ ව ස්ත්‍රී ව්‍යාපාර හා ප්‍රගතිශීලි දේශපාලන ක්‍රියාකාරීන්ගේ අවධානය යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස ලෝක මට්ටමින් විවිධ රටවල ආණ්ඩු විසින් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රමය භාවිතය කෙරෙහි අවධානය යොමු විය. ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය ඉහළ නැංවීම පිණිස පංගු ක්‍රමය පළමුව භාවිතා කරනු ලබන්නේ නෝර්ඩික් රටවල්ය. නොර්වේහි සමාජවාදී පක්ෂය විසින් 1975 වසරේදී නාමයෝජනා ලැයිස්තුවලින් 40%ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම එහි සමාරම්භය ලෙස සැලකේ. ඉන් පසු ව නෝර්වේහි අනෙකුත් පක්ෂ ද ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රමය පක්ෂ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථා මගින් තහවුරු කළේය. කැනඩාව, ඕස්ට්‍රේලියාව වැනි බටහිර යුරෝපා රටවල්ද සිය පක්ෂ ප්‍රතිපත්ති මගින් ස්වේච්ඡා පංගු ක්‍රමය හඳුන්වා දුණි. 1990 ගණන්වලදී ලතින් ඇමරිකානු කලාපීය රටවල්ද පංගු ක්‍රමය පිළිබඳ ව අවධානය යොමු කළ අතර පළමුවරට

1991 දී ආර්ජන්ටිනාව විසින් සිය නාම යෝජනා ලැයිස්තුවලින් ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් හදුන්වා දුණි. පසු ව මෙක්සිකෝව, පේරු, පැනමා, වෙනිසියුලා වැනි රටවල් ද ස්ත්‍රී නියෝජනය ඉහළ නැංවීම පිණිස පංගු ක්‍රමය යොදා ගනු ලැබිණි. බටහිර යුරෝපා හා ලතින් ඇමරිකානු කලාපීය රටවල් මෙන් ම අප්‍රිකානු රටවල් කිහිපයක ද පංගු ක්‍රමය භාවිතා කළ අතර එහි මූලාරම්භය දකුණු අප්‍රිකානු ජාතික කොංග්‍රසය විසින් සනිටුහන් කෙරුණි. ඊජිප්තුව, ජෝර්දානය වැනි මැදපෙරදිග කලාපීය රටවල ද නේපාලය, ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය හා ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවලද පංගු ක්‍රමය භාවිතා කරයි ඒ අනුව පැහැදිළි වන්නේ ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමේ උපක්‍රමයක් ලෙසින් පංගු ක්‍රමය භාවිතය සාර්ථක මෙන් ම ප්‍රචලිත ක්‍රමයක් වශයෙන් ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් විශාල ප්‍රමාණයක් භාවිතා කරන බවයි. ඒ මගින් පෙරට වඩා දේශපාලන නියෝජිත ආයතන හා තිරණ ගන්නා මට්ටම්වල ස්ත්‍රී නියෝජන ප්‍රතිශතය ප්‍රමාණාත්මක හා ගුණාත්මක අයුරින් වර්ධනයක් ද දැකිය හැකිවේ.

## පරිශීලන නාමාවලිය


පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (2016 අංක 01 දරන -සංශෝධන) පනත, 2016.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (2017 අංක 16 දරන - සංශෝධන) පනත, 2017.

ලියනගේ කමලා.(2012). ස්ත්‍රී පුරුෂ දේශපාලන නියෝජනය සමානද? පංගු ක්‍රම න්‍යාය සහ භාවිතය. කොළඹ: ෆ්‍රෙඩ්රිච් ඊබට් ස්ටිෆ්ටුන්.

Aurat Foundation (2001).Citizens Campaign for Womenes Representation in Local Government.Islamabad: Aurat Foundation and Information Service Foundation.

Bari, Farzana (2002). History of Womanes Reserved seats in Legislatures in Pakistan.Legislative watch.

Burrell, B.C (1994). Womenese Place in the House: Campaingning for Congress in the Feminist Era.Ann Arbour: University of Michigan Press.

Freidenvall, Lenita (2003). Womanes Political Representation and Gender Quotas-The Swedish Case, Working paper series.Stockholm: Stockholm University.

Htun, Mala and Jones, Mark.P (2002). Engendering the Right to Participate in decision making: Electoral Quotas and Womenes Leadership in latin America in Gender and the Politics of Right and Democracy in Latin America. New York: Palgrave.

Inter Parliamentary Union Report (2018, 2019, and 2020).

Mansbridge, Jane (1999). Should Blacks Represent Black and Women Represent Women? A Contingent 'yes'. The Journal of Politics, Vol. 61, No. 3, pp. 628-657.

Phillips, Anne (1995). The Politics of Presence. Oxford: Clarendon Press.

Rai, S.M. (1995). Women Negotiating Boundaries: gender law and the Indian State. Social and Legal Studies Vol.4, No 3.

Sawer, Marian (1999). A Matter of Simple Justice? Arguments about the Parliamentary Representation of Women, paper presented to Women' s Worlds 99, 7th International Inter – disciplinary congress on Women, Australia.

Singh, Balram (2005). The Impact and Challenges of the 73rd Amendment on the Status of Women .op.cit.

Singh, J.L (2005). Women in Panchayati Raj. New Delhi: Sunrise Publications.